

වාර්ෂික වාර්තාව

2019/20

සීමාසහිත ලංකා පොහොර සමාගම

ශ්‍රී ලාංකේය ගොවි දන සුරකිමින්

ශ්‍රී ලාංකේය ගොවි දැන සුරකිමින්

මේ ගෙවෙමින් පවතින්නේ අපේ ලෝකය පෙර නොවූ විරූ අර්බුදවලට මුහුණ දෙමින් සිටින කාලසීමාවකි. ලොව පුරා විද්‍යාඥයින් පළ කරන අනාවැකි වුව ද එතරම් සුබ නැත. වර්තමාන වසංගතය ලොව පුරා පැතිරීම සමහරුන් සලකන්නේ හුදු අයහපත් පෙර නිමිත්තක් ලෙස ය. එයට අනුරූපව, සුපුරුදු ජීවන රටාව මෙන් ම සමාජ සාරධර්ම සහ ඇවතුම පැවතුම් සියල්ල බිඳවැටීමේ සෑම හැකියාවක්ම මතුවෙමින් තිබේ.

එවැනි තත්වයකට ඔරොත්තු දිය හැකි වන්නේ, තමන්ගේ ම ආහාර නිෂ්පාදනය කරගත හැකි ස්වයංපෝෂිත මෙන් ම ස්වශක්තියෙන් අර්බුදයට මුහුණදිය හැකි රටකට හෝ ජාතියකට පමණකි. ශ්‍රී ලංකාව ඒ සඳහා ඇවැසි මූලික පදනම සහිත රටක් වුව ද එපමණකින් සෑහීමට පත්විය නොහැකි ය. එහිදී අපගේ ආහාර වගා කිරීමේ සහ සැපයුම් ජාලය අඩාල නොවන බවට සහතික වීම සඳහා සියලු දෙනාගේම දායකත්වය අතිශයින් වැදගත් වෙයි.

පසුගිය සමයෙහි වසංගතය පිළිබඳ අවදානම නොතකමින්, ලක්පොහොර කාර්ය මණ්ඩලය ලෙස අපි අපේ ජාතික වගකීම නොපිරිහෙළා ඉටු කළෙමු. සෞඛ්‍යය ගැන පවා නොසලකමින්, අපි අපේ වගකීම් දැරුවෙමු. සියලු සමාජ සංස්ථාවන් අඩපණ වුව ද ආහාර සම්පාදනය අඩාල නොවන බවට වග බලා ගත්තෙමු. අපගෙන් බොහෝ දෙනෙක් වෛරසයෙන් රෝගාතුර වූ නමුත් අපි ඉදිරියට ගියෙමු. අප සතු ජාතික වගකීම නිසි ලෙස ඉටුකරන අධිෂ්ඨානයෙන්, නිර්භීතව හා පරාර්ථකාමීව සහ එකම අරමුණකින් සටන් කළෙමු. අපි අපේ ගොවීන් ආරක්ෂා කරමින් අපි අපේ ජාතියේ ආහාර සැපයුම තහවුරු කළෙමු. අපි ඒ මෙහෙවර පිළිබඳව නිහඬව ආඩම්බර වෙමු.

ලක්පොහොර කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන,
වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය,
ශ්‍රී ලංකාව

දු.ක. : +94 11 2 868 920 | ෆැක්ස් : +94 11 2 863 497
විද්‍යුත් තැපෑල : info@agrimin.gov.lk | වෙබ් අඩවිය : www.agrimin.gov.lk

පිටපත් රචනය, ඡායාරූප,
පිටු සැකැස්ම සහ නිර්මාණය

කලාව™ | Creative Solutions

79, විජේරාම මාවත, උඩහමුල්ල, නුගේගොඩ, ශ්‍රී ලංකාව
+94 11 302 4950 | +94 71 224 11 00
kalawainfo@gmail.com

වාර්ෂික වාර්තාව

2019/20

සීමාසහිත ලංකා පොහොර සමාගම

සීමාසහිත ලංකා පොහොර සමාගම
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.

දුරකථන : 011-2 930 298 / 99 | ෆැක්ස් : 011-2 947 763
විද්‍යුත් තැපෑල : info@lakpohora.lk | වෙබ් අඩවිය : www.lakpohora.lk

අපේ ජයග්‍රහණ



ISO 14001: 2004
පාරිසරික තත්ත්ව සහතිකය



වාර්ෂික වාර්තා සම්මාන 2014
අනුකූලතා සම්මානය



JASTECA CSR සම්මාන 2014
කුසලතා සම්මානය



CNCI ඇවිවර්ස් සම්මානය 2014
ජාතික මට්ටමේ කුසලතා සම්මානය



ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන 2014
රිදී සම්මානය



ජාතික ඵලදායිතා සම්මාන 2012/13
දෙවන ස්ථානය



ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මාන 2013
රිදී සම්මානය



SLCBCC ව්‍යාපාරික තරුව 2014
රිදී සම්මාන



අකිමොටෝ එස්5 සම්මාන 2014
කුසලතා සම්මානය



ජාතික ව්‍යාපාර විශිෂ්ටත්ව
සම්මාන 2014
රන් සම්මානය



මානව සම්පත් කළමනාකරණ
සම්මාන 2013
රිදී සම්මානය

පටුන

ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තයේ පදනම	06
ආයතනික තොරතුරු	07
අප ආ ගමන්මගේ සංධිස්ථාන	10
දැක්ම හා මෙහෙවර	15
මූල්‍යමය අවධාරණයන්	17
පසුගිය වසර දහය සඳහා මූල්‍ය සාරංශය	18
සභාපතිතුමාගේ පණිවිඩය	20
සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය	24
අධ්‍යක්ෂ මණ්ඩලය	26
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	32
සමාගමේ සංවිධාන ව්‍යුහය	36
කළමනාකරණ විවරණය හා විශ්ලේෂණය	40
ආයතනික පාලනය	46
අවදානම් කළමනාකරණ වාර්තාව	48
මානව සම්පත් කළමනාකරණ වාර්තාව	51
විගණන කමිටු වාර්තාව	56
මූල්‍ය ප්‍රකාශන	68
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	71
සභාපතිතුමාගේ සහ මූල්‍ය කළමනාකරුගේ වගකීම පිළිබඳ ප්‍රකාශය	72
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව	73
ලාබ අලාබ සහ සවිස්තරාත්මක ආදායම පිළිබඳ ප්‍රකාශනය	82
මූල්‍ය ස්ථානය පිළිබඳ ප්‍රකාශනය	83
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය	84
මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය	85
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	86
පෙරකලාසි ආකෘතිය	127



ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තයේ පදනම

(ආයතනික තොරතුරු)

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ජර්මානු රජයේ මූල්‍ය හා තාක්ෂණික ආධාර ඇතිව 1964දී සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපිත කරන ලදී. මෙය කෘෂිකාර්මික, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එහි පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුයිය.

එහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලාංකික කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පොහොර අවශ්‍යතා සපුරාලීම වන අතර මෙම වගකීම අප විසින් ඉටු කරමින් සිටින අතර එහිදී අපගේ ප්‍රමුඛ අවධානය යොමු කරන්නේ නිමැවුමේ ගුණාත්මකභාවය පිළිබඳවය. මෙම වගකීම අප කාලාන්තරයක් තිස්සේ රසායනික පොහොර ආනයනය කිරීම, ගුණාත්මක පොහොර නිපදවීම සහ මිශ්‍ර කිරීම තුළින් සිදු කරන අතර අපගේ ප්‍රාදේශීය පොහොර ගබඩා ඒකක සහ බලය ලත් බෙදාහැරීම් ජාලය ඔස්සේ අපගේ පොහොර නිෂ්පාදන ලංකාව පුරාම බෙදාහැරීම ද සිදු කරයි.

එවකට රාජ්‍ය ප්‍රතිපත්තිය වූ රජය සතු සංස්ථාපිත ආයතන, 1987 අංක 23 දරන සමාගම් පනත රජයේ හිමිකාරිත්වය ඇති ව්‍යාපාරික ආයතන බවට පත් කිරීමේ වැඩපිළිවෙල යටතේ, අප ආයතනය එහි ආරම්භක නාමය වෙනස් නොකර පෙර කී සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 15 දින නැවත අප සමාගම ප්‍රතිස්ථාපිත කරන ලදි. මේ වනවිට අප සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත.

කෘෂිකර්ම ක්ෂෙත්‍රයේ ඇති රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල යටතේ තමන්කඩුව කෘෂි පොහොර සමාගම ලක් පොහොර සමාගම යටතට 2008 දී පවරා ගන්නා ලදී. මේ වන විට එය ලක්පොහොර සමාගමේ පොළොන්නරුව ප්‍රාදේශීය පොහොර ගබඩා සංකීර්ණය ලෙස ක්‍රියාත්මක වේ.

ආයතනික තොරතුරු

සමාගම් නාමය

සීමාසහිත ලංකා පොහොර සමාගම

සමාගම් ලියාපදිංචි අංකය

PB 499

නෛතික ස්වභාවය

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද
මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ණ හිමිකාරිත්වය සහිත
වගකීමෙන් සීමිත සමාගමකි.

ලියාපදිංචි කාර්යාලය සහ ලිපිනය

සීමාසහිත ලංකා පොහොර සමාගම
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2 930 298 / 99
ෆැක්ස් : +94 11 2 947 763
විද්‍යුත් තැපෑල : info@lakpohora.lk
වෙබ් අඩවිය : www.lakpohora.lk





වී වගාව
සඳහා

භාවිතා කරන යූරියා, මියුරිකේට් පොටෑෂ්, ට්‍රිපල් සුපර් පොස්පේට් සහ සින්ක් පොස්පේට් යන සෘජු පොහොර වර්ග අප විසින් ගොවීන් හට සපයනු ලබයි.

අපේ ජාතිය පෝෂණය කිරීම සඳහා අපි දුෂ්කර මාවතක ගමන් කරමු.

බරපතළ අර්බුදකාරී මෑත කාලවලදී අපට ක්‍රියාකාරී වීමට සිදු විය. එම දශක කිහිපය තුළ බොහෝ අභියෝගයන්ට මුහුණ දෙමින්, අසාර්ථකවීම් මෙන් ම ඊටත් වඩා විශාල ජයග්‍රහණ අත්කරගන්නට සමත් වීමු. මේ සියල්ල සිදුවූයේ ලංකා පොහොර සංස්ථාව හරහා ශ්‍රී ලාංකේය ජනතාව වෙනුවෙන් සේවය කළ සැබෑ කැපවීමෙන් ක්‍රියා කළ සේවක පිරිසකගේ දක්ෂතාව මත ය.

1964

ලංකා පොහොර සංස්ථාව, ගරු. ඊලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා නායකත්වය දරන කෘෂිකර්ම, ආහාර හා සමූපකාර අමාත්‍යංශය යටතේ එම අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් සෑම් සිල්වා මහතා සමාරම්භක සභාපති ලෙස, ආරම්භක ආයෝජනය වශයෙන් රු.58,000.00 ක් යොදවා ස්ථාපිත කරන ලදී. ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඩාර්ලි පාරේ පිහිටි අතර මෙට්‍රික් ටොන් 80,000 ක් හැසිරවිය හැකි ගබඩාවක් හුණුපිටියේ පිහිටුවන ලදී. සංස්ථාවට වෑන් රථයක් කුලියට ලබා ගැනීමට මුදල් නොමැති වූ නිසා එවකට ආයතනයේ සමාරම්භක සේවකයෙක් වූ කේ.කේ. ඇන්තනී මහතා වේවැල් වලින් සාදන ලද කූඩ 12ක් අළුතින් ස්ථාපිත වූ ආයතනය වෙනුවෙන් රැගෙන එම කූඩ බයිසිකලය වටා එල්ලා ගෙන ප්‍රධාන කාර්යාලය දක්වා බයිසිකලය පැද්දේය.

1966

පැයට මෙට්‍රික් ටොන් 35ක මිශ්‍ර කිරීමේ ධාරිතාවක් සහිතව හුණුපිටියේ දී මිශ්‍රණ කටයුතු අරඹන ලදී. මෙමගින් මෙට්‍රික් ටොන් 70,000 ක් මිශ්‍ර කරන ලදී. මේ සමඟ එවකට පෞද්ගලික අංශය සතු වූ පොහොර ආනයනය, නිෂ්පාදනය සහ බෙදාහැරීම් ඒකාධිකාරය සදහටම බිඳ දමන ලදී.

1970

සංස්ථාවේ පොහොර "ලක් පොහොර" වෙළඳ නාමය යටතේ අලෙවි කරන ලදී.

1976

බලපත්‍ර ක්‍රමය අහෝසි කළ අතර පොහොර සහනාධාරය හඳුන්වා දෙන ලදී.

1977

විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ, අංශයේ නායකත්ව තත්ත්වය සංස්ථාවට අහිමි විය. පෞද්ගලික අංශයේ තරඟයට දැඩිව ප්‍රතිචාර දක්වමින් සංස්ථාව එහි බෙදා හැරීමේ ජාලය පුළුල් කරන ලද අතර මේ දක්වා එය සිදු වනුයේ සමූපකාර, කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන හා බලයලත් පෞද්ගලික අලෙවි නියෝජිතයින් තුලින් පමණි.

1978

ජර්මානු රජයෙන් ලැබුනු රු. මිලියන 28 ක ප්‍රදානයක් හා තාක්ෂණික ආධාර යටතේ ප්‍රාදේශීය ගබඩා සංකීර්ණ මහව, වැලිගම, පොළොන්නරුව සහ අනුරාධපුර ඉදිකිරීම් ඇරඹීය.

1980

අලුතින් ස්ථාපනය කරන ලද ගබඩා සම්පූර්ණ සේවයට එක් කළ අතර ඒවායේ ධාරිතාවය මෙට්‍රික් ටොන් 13,000 ක් සහ 16,000 ක් අතර විය. පළමු වතාවට ප්‍රචාරන පත්‍රිකා සංස්ථාව විසින් සකසා බෙදා හරින ලදී.

1986

රජය විසින් පොහොර බෙදාහැරීම ප්‍රශස්ත කිරීමට පොහොර සම්බන්ධීකරණ කමිටුව පිහිටුවන ලදී. මෙම කමිටුව හරහා පොහොර භාවිතය ගැන පළමු අධ්‍යාපන, පුහුණු සහ දැනුවත්කිරීමේ වැඩසටහන් කෘෂිකාර්මික ප්‍රජාව ඉලක්ක කොට සිදු කරන ලදී.

1988

ජර්මානු රජයේ රු. මිලියන 22 ක් වූ ප්‍රතිපාදන යොදා ගෙන හුණුපිටියේ පිහිටි මධ්‍යම ගබඩා සංකීර්ණය නවීකරණයට ලක් කළේය. එයට පැයකට මෙට්‍රික් ටොන් 30 ක ධාරිතාවයකින් යුතු නව මිශ්‍රණ යන්ත්‍රයක් හඳුන්වා දෙන ලදී.

1992

රජය විසින් සංස්ථාව සතු වත්කම් අලෙවි කිරීමේ වැඩපිළිවෙලත් සමඟ මෙම වසර වැදගත් වසරක් විය. හුනුපිටිය සංකීර්ණය ලංකා පොහොර සංස්ථාව බවට පත් වූ අතර අනෙකුත් ගබඩා වල භූගෝලීය පිහිටීම මත වගකීමෙන් සීමිත සමාගම් 5 ක් ඇති කළේය. පසුව මෙයින් තුනක් පෞද්ගලික අයිතියට විකිණූ අතර තමන්කඩුව පොහොර සහ ලංකා පොහොර සංස්ථාව වෙන් වෙන් වූ ආයතන 2 ක් ලෙස කටයුතු කළේය.

1994

පොහොර සහනාධාරය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ වගකීම ලක් පොහොර සංස්ථාවට පැවරිය. ගෙවුනු යුධ වසරවලදී, සැලකිය යුතු ත්‍රස්තවාදී බලපෑම් නොසලකා සංස්ථාව විසින් දුෂ්කර හා සෘජුව සම්බන්ධ නොවූ ප්‍රදේශවලට පොහොර සැපයීමට මහන්සි වී කටයුතු කරන ලදී.

2002

ලංකා පොහොර සංස්ථාවේ චැතම් මාවතේ පිහිටි ප්‍රධාන කාර්යාලය හුණුපිටිය සංකීර්ණයට මාරු කරන ලදී.

2005

එවකට පැවැති රජය විසින් ඉතිහාසගත පොහොර සහනාධාර වැඩපිළිවෙල අරඹන ලදී. ගොවීන් 70% කට සහනාධාරයක් ලබා දෙමින්, කි.ග්‍රෑ. 50 පොහොර මිටියක් රු. 350.00 ට ලබා දීමේ දැවැන්ත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළේය.

2007

ආයතනය සතු මිලියන 330 ක ශුද්ධ වත්කම් රතු කලාපයට යොමු කරමින්, ආයතනය දැඩි මූල්‍ය අවධානයකට ලක් විය.

2008

රජය විසින් රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය නොකරනවා කියන පොරොන්දුව යටතේ ආයතනයට නව කළමනාකරණ මණ්ඩලයක් පත් කරන ලද අතර සමාගම නැවත 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදී.

2010

බුද්ධිමත් තීරණ මත ඉදිරියට ගිය ආයතනය පැවැති අවදානම් රතු කලාපයෙන් මිදීම ආරම්භ විය. සමාගම පරිවර්ථනයකට ලක් කරමින්, 2013 වන විට එය සතුව ශුද්ධ වත්කම් රු. මිලියන 1606 ක් සතු වූ අතර, මහා භාණ්ඩාගාරයට රු. මිලියන 39 ක මුදලක් ලාභ ලෙස ගෙවන ලදී.

2013

GPS තාක්ෂණය සහිත ප්‍රවාහන ජාලයක් සේම රට පුරා පැතිරුන ඉහළ ගුණාත්වයෙන් යුතු පොහොර ගබඩා 52 ක් පිහිටුවීය.

2016

2016 වසරේ දී රජය විසින් කාබනික වගාව වෙත අවධානය යොමු කරමින් වස විසෙන් තොර රටක් ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේය. අප පොහොර සමාගම කාබනික පොහොර පිළිබඳ අවධානය වැඩි කරමින් මෙම ප්‍රතිපත්තිය හා අනුගත විය.

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

සෝමචන්ද්‍ර ජයකොඩි මහතා
(01.04.2019-03.12.2019)

සරත් සමරකෝන් මහතා
(31.12.2019-31.03.2020)

අධ්‍යක්ෂවරු

එස්. ජී. කේ. ඩී. පෙරොමි රෙජී මහතා
(01.04.2019-02.12.2019)

බී. ඩී. මහීලාල් චන්දිම මහතා
(01.04.2019-03.12.2019)

එස්. එල්. ගමගේ බන්දුසිරි මහතා
(01.04.2019-31.03.2020)

කෝසල ජයකොඩි මහතා
(15.01.2020-31.03.2020)

ඊ. ජී. ජී. එච්. මධුකා රණසිංහ මහත්මිය
(13.01.2020-31.03.2020)

එම්. ටී. අයි. විශාකා අමරසේකර මහත්මිය
(01.04.2019-03.12.2019)

එම්. පී. සරත් අබේරත්න මහතා
(01.04.2019-03.12.2019)

ඩබ්. පී. දිමුතු පැතුම් මහතා
(15.01.2020-31.03.2020)

එච්. කේ. සී. තාරුක අල්විස් මහතා
(15.01.2020-31.03.2020)

එල්. ගැමුණු සමරවික්‍රම මහතා
(15.01.2020-31.03.2020)

සමාගම් ලේකම්

ඒ. එම්. චමිලා ස්වර්ණමාලි තිලකරත්න මහත්මිය

කළමනාකරණ කණ්ඩායම

ආර්. ඒ. පී. පෙරේරා මහතා	සාමාන්‍යාධිකාරී (වැඩ බලන) කළමනාකරු (බෙදාහැරීම්
බී. ඩී. එල්. කුමාරසිරි මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක
ඉංජිනේරු ඩී. එම්. එන්. ඒ. දිසානායක	කළමනාකරු (තාක්ෂණික)
ආර්. පී. එස්. බෝධිපාල මහත්මිය	කළමනාකරු (විකුණුම් සහ අලෙවි ප්‍රවර්ධන)
යූ. පෙරේරා මහත්මිය	කළමනාකරු (රසායනාගාරය)
පී. පී. සමන් මහතා	කළමනාකරු (වැඩබලන) (ප්‍රසම්පාදන සහ ආනයන)
එම්. ජී. ඩී. ගයනි මහත්මිය	කළමනාකරු (වැඩබලන) (මූල්‍ය)
ටී. එස්. එස්. ධර්මබන්ධු මහත්මිය	කළමනාකරු (වැඩබලන) (පරිපාලන හා මානව සම්පත්)



තේ වගාව

සඳහා

ටී-65, ටී-200, ටී-750, යූටී-1625, යූටී-397, යූටී-752,
වීපීවල්සී-880, වීපීවල්සී-945, වීපීයූවම්-910, යූ-625,
එස්ටී/යූවම්-400, එස්ටීයූවීවී-435, යූ-709





අරමුණ

ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව නිෂ්පාදනය කරන ලද රසායනික සහ කාබනික පොහොර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාව වෙත සැපයීම

දැක්ම

ශ්‍රී ලාංකික පොහොර වෙළෙඳපොළ නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වූ නව ලොවට ගැලපෙන ප්‍රමුඛතම ආයතනය වීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලක් පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදන, ආදායම හා ලාභදායිත්වය වැඩි කිරීම සඳහා බහුවිධ වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීම.

වටිනාකම්

පාරිසරික තිරසාරත්වය පවත්වාගැනීම සහ බිම් මට්ටමෙන් ගොවීන් සමඟ සම්බන්ධව කටයුතු කිරීම අපගේ මූලික වටිනාකම් වන අතර, අප විසින් අපගේ අනාගත නිෂ්පාදන මාලාව ගොඩනගනුයේ ඒවා මතය.



වළුවලි සහ වෙනත් වාණිජ බෝග

සඳහා

එළවළු, පලතුරු, අල වර්ග, මිරිස්, කව්පි, රටකජු,
මුං ඇට සහ ඉරිඟු යනාදිය සඳහා විශේෂයෙන්ම
මිශ්‍ර කරන ලද පොහොර

මූල්‍ය අවධාරණයන්



මූල්‍ය අවධාරණයන් හා අනුපාත			
අයිතමය	**2020**	**2019**	**වෙනස (%)**
	රු.	**රු.**	**%**
ආදායම	2,100,583,296	1,869,949,695	12
බදු පෙර ලාභය	188,443,929	119,782,045	57
බදු පසු ලාභය	97,993,276	(34,506,078)	384
කොටසක ඉපැයුම	1.95	(0.69)	383
වත්කම් මත ප්‍රතිලාභ	8.28	6.90	20
වගකීම් මත ප්‍රතිලාභ	0.34	0.34	0

මූලයම තත්ත්ව අවධාරණයන් හා අනුපාත			
අයිතමය	**2020**	**2019**	**වෙනස (%)**
සමස්ත වත්කම්	රු. 25,366,775,513	27,082,981,082	-6.34
සමස්ත හිමිකම්	රු. 6,141,242,690	රු. 5,531,184,013	11.03
නිකුත් කළ කොටස් සංඛ්‍යාව	50,245,608	50,245,608	0
කොටසකට ශුද්ධ වත්කම්	රු. 110	රු. 116	11.03

පසුගිය දස වසර තුළ මූල්‍ය අවධාරණයන්

	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර (මාස 7 ක් සඳහා)	ශ්‍රී.ල.ගි.ප්‍ර (මාස 7 ක් සඳහා)	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර	ශ්‍රී.ල.ගි.ප්‍ර
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය										
ආදායම	2,246,402,738	2,496,268,383	2,450,132,816	2,563,549,727	3,835,989,834	4,242,769,733	2,350,637,985	3,373,989,990	1,869,949,695	2,100,583,296
දළ ලාභය	414,124,001	310,189,751	621,684,097	575,467,461	855,558,167	1,097,447,923	231,025,777	31,497,063	189,371,158	267,726,824
වෙනත් ආදායම්	157,164,017	197,912,757	108,809,998	93,172,755	142,197,667	122,926,594	29,096,825	45,440,368	107,856,870	209,623,485
බදු පෙර ලාභය	73,979,009	159,544,495	199,894,319	241,328,764	520,200,738	836,604,005	127,804,541	39,346,123	119,782,045	188,443,929
බදු	(43,666,668)	(52,315,944)	(73,037,738)	(62,869,313)	134,184,888	(233,331,176)	11,787,491	(63,882,188)	(154,288,123)	(90,450,653)
බදු පසු ලාභය	30,312,341	107,228,551	126,856,581	178,459,452	386,015,851	603,272,829	139,592,032	(24,536,064)	(34,506,078)	97,993,276
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය										
ප්‍රකාශිත ප්‍රාග්ධනය	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080	502,456,080
ප්‍රත්‍යාගණන සංචිත	1,986,087,280	1,836,179,780	1,835,723,580	1,835,723,580	1,833,071,080	1,833,071,080	2,506,976,187	2,028,858,589	2,291,788,758	2,297,282,725
රඳවා ගත් ඉපැයුම්	224,109,054	1,285,578,730	1,397,891,510	1,500,363,432	1,869,914,195	2,392,840,203	2,494,732,936	2,792,590,448	2,736,939,175	3,341,503,885
මුළු හිමිකම්	2,712,652,414	3,624,214,590	3,736,071,170	3,838,543,092	4,205,441,355	4,728,367,363	5,504,165,203	5,323,905,117	5,531,184,013	6,141,242,690
දේපළ, පිරියත හා උපකරණ	1,895,412,152	1,908,557,760	1,882,887,059	1,879,174,306	1,865,055,225	1,838,655,988	2,683,237,393	2,636,328,307	2,744,935,187	2,705,686,663
නොනිමි ප්‍රාග්ධන වැඩ	542,901	-	-	-	29,982,587	32,152,294	21,960,737	22,316,114	676,729	676,729
විලම්බිත බදු වියදම	-	4,862,949	73,037,738	5,561,375	37,484,888	-	-	(29,754,455)	154,288,123	5,493,967
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය	434,767,955	471,025,753	338,620,163	471,894,936	489,125,747	514,903,604	532,548,539	583,043,365	634,370,554	698,334,484
අස්පෘශ්‍ය වත්කම්	-	-	669,017	344,717	115,417	79,667	-	-	17,501,026	13,754,126
විලම්බිත බදු වත්කම්	76,814,523	71,951,574	-	-	-	-	-	-	-	-
ශුද්ධ ජංගම වත්කම්	6,975,143,544	1,706,541,296	1,915,693,141	2,025,842,182	2,417,551,302	2,963,028,124	3,020,938,645	16,516,623,681	9,121,613,694	3,658,556,182
විලම්බිත බදු බැරකම්	-	-	1,086,164	6,647,539	44,132,427	40,928,542	155,078,112	602,124,755	643,022,709	169,037,795
කෙටි/ දිගුකාලීන ණය	5,369,929,928	-	-	17,728,367,618	31,304,325,268	-	-	20,746,712,026	14,795,213,338	14,103,482,956
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය										
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(16,012,155,140)	12,695,227,509	(9,517,159,808)	(5,094,105,859)	(9,560,794,959)	(738,936,570)	11,542,320	8,052,725,854	4,431,360,823.00	(282,165,789)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(36,565,665)	(8,458,411)	83,232,936	(508,688,188)	(1,021,212,231)	(1,086,700,012)	(591,862,107)	(908,705,035)	1,301,050,014.00	1,435,897,612
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	16,168,483,382	(13,079,312,780)	9,575,483,282	5,654,013,585	10,614,850,014	(3,843,885,272)	834,304,831	(7,628,967,604)	(5,966,502,687.00)	(691,730,383)
වෙනත් තොරතුරු										
කොටසක ඉපැයුම් (රු.)	0.60	2.13	2.52	3.55	7.68	12.01	2.78	(0.49)	(0.69)	1.95
කොටසක ඉපැයුම් (රු.)	0.18	0.18	0.76	1.05	2.30	3.60	0.83	(0.15)	(0.21)	0.59
කොටසකට ශුද්ධ වත්කම් (රු.)	54	72	74	76	84	94	110	116	110.00	122.22
ජංගම අනුපාතය (වාර ගණන)	1.29	1.08	1.08	1.06	1.06	1.09	1.10	2.60	1.60	1.19



හෙල්වගාව
සඳහා

වයි.පී.එම්. (ඩබ්ලිව්) (ඩී), ඒ.පී.එම්. (ඩබ්ලිව්)/(ඩී)
රා මැදීම (ඩබ්ලිව්)/(ඩී)

සභාපතිතුමාගේ පණිවිඩය



"අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ලක් පොහොර සමාගම වෙත ජයගත යුතු සුවිශේෂ අභියෝග සමූහයක් සහ ඵලදායී අවස්ථාවන් රැසක් ඉදිරිපත් කර ඇත."

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මට ඉමහත් සතුටකි.

1964 වසරේ සිට ලක් පොහොර සමාගම වී සහ අනෙකුත් බෝග සඳහා පොහොර ආනයනය, සංයෝග කිරීම සහ තොග අලෙවියෙහි රාජ්‍ය අංශයේ ප්‍රමුඛයා විය.

සීමාසහිත ලක් පොහොර සමාගමේ වසර 57ක ඉතිහාසය තුළ, ජාතියේ කෘෂිකාර්මික ප්‍රජාවට අවශ්‍ය ඵලදායී ව්‍යාපාරික ආකෘතියක් මගින් මෙහෙයවනු ලබයි. ලක් පොහොර සමාගම අඛණ්ඩව දියුණුව කරා ගමන් කරමින් සහ ලාභදායී සමාගමක් ලෙස පැවතීමට ස්ථිර අධිෂ්ඨානයක් සහිතව කටයුතු කර ඇත.

බාහිර පරිසරයේ සිදුවන සෑම වෙනස්කමක්ම කෙනෙකුගේ දක්ෂතාවය ඔප්පු කිරීමට අභියෝගයක් හෝ අවස්ථාවක් ලබා දෙයි. අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ලක් පොහොර සමාගම වෙත ජයගත යුතු සුවිශේෂ අභියෝග සමූහයක් සහ ඵලදායී අවස්ථාවන් රැසක් ඉදිරිපත් කර ඇත.

සීමාසහිත ලක් පොහොර සමාගම මෙම වෙනස්කම් කල්තියා අපේක්ෂා කළේ දුර දක්නා නුවනැසින් කටයුතු කරමිනි. මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා අපි පූර්ණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළෙමු. ආයතනික ඵලදායිතාව, සේවා ගුණාත්මකභාවය, පොහොරවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ සංවිධානයේ



දැක්ම, ඉලක්ක, අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම මෙහි අරමුණ විය. මීට අමතරව, සැලසුම්ගත වැඩිදියුණු කිරීම් සහ මැදිහත්වීම් හරහා එහි ප්‍රකාශිත ඉලක්ක සපුරාලනු ඇත. සමාගමේ මූලෝපාය, ව්‍යුහය, පද්ධති, ක්‍රියාවලි සහ පුද්ගලයින් උපාය මාර්ගික පරිපාලනය සඳහා උපකාර කරනු ඇත. එය සමාගමෙහි අනාගතය සඳහා පැහැදිලි මාවතක් සකසන ප්‍රායෝගික මෙවලමක් වන අතර එමඟින් උපායමාර්ගික මඟපෙන්වන්නන්ගේ දැක්ම පරිණත වීමට සහ කාලයත් සමඟ වෙනස් වීමට ඉඩ සැලසෙනු ඇත.

ගොවිජන සේවා මධ්‍යස්ථාන 376ක් හරහා වී ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා හම්බන්තොට, කන්තලේ, හුණුපිටිය යන ප්‍රදේශවල නව ගබඩා ඉදිකරමින් ද, දිවයින පුරා බලයලත් අලෙවි නියෝජිතයන් දහසකට අධික සංඛ්‍යාවක් පත්කරමින් ද ලක් පොහොර සමාගම, සිය ගබඩා ධාරිතාව ක්‍රමයෙන් පුළුල් කිරීමට පියවර ගෙන ඇත. සමාගමෙහි දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලය ප්‍රාදේශීය පොහොර වෙළෙඳසල් 45 කින් සමන්විත වන අතර සිය නිෂ්පාදන ගොවීන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් ද සපයයි. තව ද, නව පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා අදාළ වෙළඳපොළට නව්‍යකරණය කරන ලද නිෂ්පාදන හඳුන්වාදෙනු ලබන අතර දැනට සමීපව සිටින ගනුදෙනුකරුවන් සමඟ සබඳතා පුළුල් කර ගැනීමට ද අවස්ථාව ලබා දී ඇත.

වෙළෙඳ පොළෙහි ප්‍රවණතා සහ යථාර්ථයන් මෙන්ම ගෝලීය සහ දේශීය ප්‍රවණතා අවබෝධ කර ගැනීමට සමාගම වැඩි අවධානයකින් කටයුතු කරන අතර දේශීය හා ජාත්‍යන්තර කාබනික පොහොර සැපයුම්කරුවන් සමඟ එක්ව කාබනික කෘෂිකාර්මික පොහොර යෙදවුම් වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමට ද පියවර ගෙන ඇත.

පොහොර ව්‍යාපාරයේ අනාගතය රඳා පවතින්නේ එවැනි සුසමාදර්ශී වෙනස්කම් මත බව සමාගම හොඳින් දැනුම්වත් ය. එබැවින්, කාබනික පොහොර අලෙවියේදී වෙළෙඳපොළ ප්‍රමුඛයා ලෙස ස්ථානගත වීම සඳහා ගොවි අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දෙමින් සමාගම විසින් නිෂ්පාදන ක්‍රියාවලියේ සිට ගොවියාට බෙදා හැරීම දක්වා පුළුල් ක්‍රියාදාමයකට මුල පුරා ඇත.

කොරෝනා වයිරස් වසංගතය නිසා ක්‍රියාකාරකම්වල සහ ව්‍යාපාර ක්‍රියාත්මක වන ආකාරයෙහි වෙනස්කම් රැසක් සිදුවී ඇත. මෙම වෙනස කොවිඩ්-19 පශ්චාත් යුගයේ මතුවන නව යථාර්ථයන්ට අනුගත වීම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සමාගම්වලට බලපෑම් කරයි. මෙම අර්බුදයේ වැදගත්ම අභියෝගය වන්නේ වත්මන් සේවක කණ්ඩායම් අපවෙත රඳවා තබා ගැනීම සහ අභිප්‍රේරණය කිරීමයි. මේ සඳහා, අපගේ සේවකයින්ට ප්‍රවාහනය ලබා දීම හෝ නිවසේ සිට වැඩ කිරීමේ හැකියාව ලබා දීම වැනි ප්‍රතිව්‍යුහගත කිරීම් මඟින් සේවකයින්ට වැඩි අතහිතදීමක් ආරම්භ කරන ලෙස අපි යෝජනා කළෙමු.

සේවකයින්ට සම්පූර්ණ වේතනය, වර්ධක, බෝනස් සහ දිරි දීමනා වැඩි කිරීම මගින් ඔවුන් දිරිගැන්වීමු. මීට අමතරව, සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රශස්ථ සෞඛ්‍ය පහසුකම් සැපයීමට ද අපි පියවර ගත්තෙමු.

අනාගතයට මුහුණ දීම සඳහා අපගේ කාර්ය මණ්ඩලයට සමාගමේ අභිවෘද්ධිය සඳහා පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අපි අවධානය යොමු කළෙමු. තව ද, නිශ්චිත අයවැය ප්‍රතිපාදන නොමැතිව වුව ද මිලියන 200ක් වටිනා අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ ප්‍රධාන ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවා ඇති අතර, මෙම ව්‍යාපෘතිය යථාර්ථයක් බවට පත්කිරීමට අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා ලබාදුන් සහයෝගයට මම ගරු අමාත්‍යතුමාට ස්තූතිවන්ත වෙමි.

ලක් පොහොර සමාගම සමාලෝචිත වර්ෂය තුළ මානව කේන්ද්‍රීය ඵලදායිතාවයේ අඛණ්ඩ වර්ධනය සමඟ ධාරිතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළේය. මානව සම්පත් සැලසුම් කිරීම ලක් පොහොර සමාගමෙහි දිගුකාලීන සහ කෙටි කාලීන උපාය මාර්ගික අරමුණු වල නියමිත ඉලක්ක කෙරෙහි බලපෑවේ ය. එබැවින්, ශ්‍රම බලකායේ හැකියාවන් සහ ධාරිතා අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන වැදගත් වෙනස්කම් විසඳීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී.

දිගුකාලීන ආයතනික තිරසාරභාවය සඳහා ම, මූලික නිපුණතා සහ අනාගත අරමුණු, දිගු කාලීන උපාය මාර්ගික අරමුණු සඳහා වර්ගීකරණය කර ඒ අනුව උපාය මාර්ගික සිතියමක් සකස් කරන ලදී. 2020 වසර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාවගේ වර්ධනයට සහ සංවර්ධනයට අවස්ථා සහිත අභියෝගාත්මක වසරක් වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. අපගේ ඉලක්ක සපුරා ගැනීමට සහ වර්ධනය සඳහා නව අවස්ථා ග්‍රහණය කර ගැනීමට අපගේ පළපුරුදු සහ ජවසම්පන්න කණ්ඩායමට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරමු.

අපගේ ජයග්‍රහණය සඳහා නොසැලෙන සහයෝගයක් ලබා දුන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, ගරු මහින්දානන්ද අලුත්ගමගේ කෘෂිකර්ම අමාත්‍යතුමාටත්, රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට මාගේ අවංක කෘතඥතාව සහ ප්‍රණාමය පුද කරමි. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ටත්, අප කළමනාකාරීත්ව කණ්ඩායමේ සාමාජිකයින්ටත්, ලක්පොහොර පවුලේ සියලුම සාමාජිකයින්ටත් මාගේ ස්තුතිය සහ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



ජනත් විදනගේ
සභාපති



රබර් වගාව

සඳහා

ආර්.ඒ. 465, ආර්.යූ - 462, ආර්.යූ - 465, ආර්/ වයි.බී,
ආර්/ඩබ්.ඒ ඇතුළු විශේෂ මිශ්‍ර පොහොර



සාමාන්‍යාධිකාරිවරයාගේ ප්‍රකාශය

2019/2020 මූල්‍ය වර්ෂය සඳහා ජාතියට ප්‍රමුඛතම පොහොර සපයන්නා වන සීමාසහිත ලංකා පොහොර සංස්ථාවේ වාර්ෂික වාර්තාවට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමටත්, අපගේ වටිනා කොටස් හිමියන්, අපගේ හවුල්කරුවන් සහ පාර්ශවකරුවන් මූල්‍ය වර්ෂය අවසානයේ ඇමතීමටත් මම සතුටු වෙමි.

> "ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තයේ පැරැණි ඉතිහාසයේ පවා ස්වභාවික කාබනික සම්පත් වැදගත් කාර්යභාරයක් ඉටු කළේය."

ලංකා පොහොර සංස්ථාව යනු අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව සහන මිලට පොහොර සැපයීමේ ජාතික වැඩසටහනේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයයි. මෙම ප්‍රතිපත්ති රාමුව තුළ, අපි දැන් අපගේම උපාය මාර්ගයක් ස්ථාපිත කිරීමේ මෙහෙවර තීරණාත්මක ක්‍රියාවලියක යෙදී සිටිමු. සමාලෝචනයට ලක්වන වර්ෂය තුළදී, සංවිධානයේ දිගුකාලීන උපාය මාර්ග සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා ඉදිරිපත් කර ඇති වර්ධන අවස්ථා ඇගයීමට ලක් කළ අතර පුද්ගලික අංශයේ පොහොර සමාගම් සමඟ තරග වදිමින් අප ආයතනය විසින් වෙළඳපොළේ ප්‍රධාන කොටසක් අත්පත් කරගෙන ඇති බව වාර්තා කිරීමට මම සාඩම්බර වෙමි.

වර්ධනය වෙමින් පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ලෝකයේ අනෙකුත් රටවල් මුහුණ දෙන විවිධ ගැටලු සහ අභියෝග නොතකා, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ශීඝ්‍ර දියුණුව මෑතදී ලබා ගත් සාපේක්ෂ ආර්ථික ප්‍රගතිය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

සමාලෝචිත වර්ෂය කෘෂිකාර්මික අංශයේ කාර්ය සාධනය සඳහා ඉහළ පෙළඹවීමක් දක්නට ලැබුණු අතර ඒ සඳහා අවශ්‍ය ශක්තිය පොහොර වූ අතර නොමිලේ

පොහොර නිකුත් කිරීමට රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය කෘෂිකර්මාන්තයේ දියුණුව සඳහා කැපී පෙනෙන පියවරක් විය. මේ අවස්ථාවේදී සමස්ත ගොවිජනතාවගේ අභිවෘද්ධිය සඳහා රජය දරන උත්සාහයට දායක වීමට ලංකා පොහොර සමාගමට ද හැකි විය.

මෙම ප්‍රතිපත්ති වෙනස් වීමෙන් පසු රටේ කෘෂිකාර්මික ප්‍රජාවට පොහොර ආනයනය කරන්නා, නිෂ්පාදකයා, අලෙවි කරන්නා සහ බෙදාහරින්නා ලෙස, ලක් පොහොර සමාගම ජාතියේ කෘෂිකාර්මික ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටියේය. සමාගමට නායකත්වය දුන් නායකයින්ගේ මඟ පෙන්වීම, ශක්තිමත් කළමනාකරණ කණ්ඩායමක් සහ විශ්වාසවන්ත සේවකයින් ජාතික සංවර්ධනයේ යෝධ බලවේගයක් ලෙස ඉදිරියට යාමට අපට සවියක් විය. දැවැන්ත කණ්ඩායම් ප්‍රයත්නයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය ලාභදායී විය. 2020 දී, උපායමාර්ගික සැලසුම් කිරීම සහ වැදගත් වෙනස්කම් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රධාන කඩයිම් රැසක් සාක්ෂාත් කර ගැනීමට හැකි විය. 2020 වර්ෂය තුළ සීමාසහිත ලංකා පොහොර සමාගමෙහි ශුද්ධ වත්කම් රුපියල් බිලියන 25.36 ක් විය. දිගු කාලීන උපාය මාර්ගයක් භාවිත කිරීම තුළින් සමාගම බදු ගෙවීමට පෙර ලාභය වසරින් වසර මිලියන 119.78 සිට රුපියල් මිලියන 181.90 දක්වා වැඩි කර ගෙන ඇති අතර එය මෑත වසරවල ඉහළම වර්ධනය විය. උපායමාර්ගික පිළිවෙත් වේගවත් කරන ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම හරහා රටේ වඩාත් බරපතල සමාජීය සහ පාරිසරික අභියෝග කිහිපයකට විසඳුම් නිර්මාණය කිරීමට මෙන් ම සමාජයට පුළුල් ප්‍රතිලාභ ලබා දීමට අපට හැකි විය.

ශ්‍රී ලංකාව පුරා කාබනික සංකල්පය පිළිබඳ තිරසාර ප්‍රතිඵල ගෙන දීම සඳහා පැරණි භාවිතයන් ප්‍රතිනිර්මාණය කරමින් දේශීය කෘෂි කර්මාන්තයේ විප්ලවීය වෙනසක් කිරීමේ දූරදර්ශී දැක්මක් ඇතිව උපාය මාර්ගික සැලසුම් රැසක් ක්‍රියාත්මක කිරීමට සමාගම සමත් විය.

අවට පරිසරය තම එදිනෙදා ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස සැලකූ දේශීය ගොවීන්ට කාබනික පොහොර භාවිතය පිළිබඳ සංකල්පය කිසිදා ආගන්තුක වී නැත. ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තයේ පැරණි ඉතිහාසයේ පවා ස්වභාවික කාබනික සම්පත් වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. කෘෂිකාර්මික කටයුතු සඳහා කාබනික පොහොර භාවිතා කිරීමේ වඩාත් සවිස්තරාත්මක හා දියුණු ක්‍රමවේද සමඟින් අපට නිසැකවම අතීතයෙන් පාඩම් ඉගෙන ගෙන ඉදිරියට යා හැකිය යන හැඟීම ඇතිව, දිවයින පුරා ගොවීන් සහ වැවිලිකරුවන් අතර කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීම සඳහා නව ව්‍යාපෘති සැලසුම් කර ආරම්භ කර ඇත.

ලක්පොහොර පවුලේ සියලුම සාමාජිකයින් එහි අනාගතය සඳහා බලාපොරොත්තු දල්වාගෙන සිටින බැවින් අපි දක්ෂතා ගොඩනැගීමේ වියදම් සහ සමාගමේ අනාගත ප්‍රවර්ධන වියදම් අඩු කිරීමට යොමු නොවෙමු. මෑත වසරවලදී සමාගම තරුණයින් පුහුණු කිරීම සහ අපගේ පළපුරුදු සේවකයින් නැවත පුහුණු කිරීම සඳහා විශාල ලෙස ආයෝජනය කළේය. අපගේ විශ්වාසවන්ත සේවකයින්ගේ දිගුකාලීන ප්‍රතිලාභය සඳහා මෙම කැපවීම් දිගටම කරගෙන යාමට අපි අවධානය යොමු කරමු. ලක්පොහොර පවුල සැමවිටම අපගේ ව්‍යාපාරයේ හදවතයි. අපගේ අතීත, වර්තමාන සහ අනාගත සාර්ථකත්වය මුළුමනින්ම ඔවුන් මත රඳා පවතින අතර ලක්පොහොර පවුලේ සාමාජිකයින්ගේ කැපවීමට අවංකවම ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.



ආර්. ඒ. පී. පෙරේරා
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)

අධ්‍යක්ෂ මණ්ඩලය



ජනත් විද්‍යානගේ මහතා
සභාපති

ජනත් විද්‍යානගේ මහතා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යාපන ආයතනයක් වන රාජකීය විද්‍යාලයේ නිමැවුමකි. ඔහු තමා අත ගසන සෑම ව්‍යායාමයක් ම විනය, අරමුණ සඳහා කැපවීම ඔස්සේ සාර්ථකත්වය කරා ගෙන යාමේ හැකියාවක් ඇත්තෙකි. ඔහුගේ යුගයේ හොඳම පාසල් බොක්සිං ක්‍රීඩකයෙකු වූ ඔහු ක්‍රීඩාවේ වර්ණකයෙකි. මීට අමතරව, ඔහු පාසල් ඔරු පැදීමේ කණ්ඩායමේ ඔරු පැදීමේ ක්‍රීඩකයෙකු ලෙස ද්විත්ව වර්ණ ලබා ගෙන ඇත. ඔහුගේ නායකත්ව දක්ෂතා හඳුනා ගනිමින් විද්‍යාල ශිෂ්‍ය නායකයකු ලෙස පත්වීමේ වරම ඔහුට හිමි විය. ඔහුගේ පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු ඔහු හැටන් නැෂනල් බැංකුව හා සම්බන්ධ වීමට පෙර රුසියාවේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා ශිෂ්‍යත්වයක් දිනා ගත්තේය. කැතේ පැසිෆික් සමාගමෙහි කළමනාකරු ලෙස සම්බන්ධ වූ ඔහු වසර ගණනාවක් වීම තනතුර දැරූ අතර වීම කාලය තුළ ඔහු සංචාරක කර්මාන්තයේ වඩාත්ම විශ්වාසදායක පුද්ගලයෙකු ලෙස නමක් දිනාගන්නට සමත් විය. ඔහුගේ සේවා කාලය පුරාවට සංචාරක ව්‍යාපාරය කෙරෙහි ඇති උනන්දුව කිසි විටෙකත් අත් නොහල ඔහු දැන් ඔහුගේ ම සංචාරක සමාගමක හිමිකරු ද වේ.

ශ්‍රී ලංකාවෙන් වැඩිපුරම සංචාරය කළ පුද්ගලයන් අතරින් තම වෘත්තීය ජීවිතය තුළ රටවල් 137 කට සංචාරය කර ඇති අතර, ඔහු තම සංචාරයන්හි දී ලබාගත් විශාල අත්දැකීම් ඔහු සම්බන්ධ සෑම ව්‍යාපාරයකටම උපයෝගී කරගනියි. කිසිවිටෙකත් රට වෙනුවෙන් කළ යුතු තම යුතුකම පැහැර හැරීමට කටයුතු නොකළ ඔහු සීමාසහිත ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා ලෙස ජාතියට කරන සේවය දිගටම කරගෙන යාමට පෙර ලංකා විදුලිබල සමාගමේ (LECO) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද සේවය කළේය. මේ හැරෙන්නට කෘෂිකර්මාන්තය හා උද්භිද විද්‍යාව කෙරෙහි ජීවිත කාලය පුරාම උනන්දුවක් දක්වමින් කටයුතු කර ඇත. ජීවිතයට ප්‍රවේශ වීමේදී කවදත් නිහතමානී වන ඔහු, ලෝකය තමාගේ දැක්ම සහ ක්‍රියාමාර්ග පිළිගත්තත් නැතත් ශ්‍රී ලංකාවට යහපතක් යැයි හැඟෙන දේ ඉටුකරන්නට කිසිවිටෙකත් පසුබට නොවන්නෙකි.

සෝමචන්ද්‍ර ජයකොඩි මහතා - සභාපති
(01.04.2019-03.12.2019)

සරත් සමරකෝන් මහතා- සභාපති
(31.12.2019-31.08.2020)



එස්. එල්. ජී. බන්දුසිරි මහතා
අධ්‍යක්ෂ

එස්. එල්. ජී. බන්දුසිරි මහතා රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් ද, මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන යන අමාත්‍යාංශ නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා ලෙස සීමාසහිත ලංකා පොහොර සමාගමට පත් කරන ලදී. ඔහු රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව ඇතුළු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය කිහිපයක මණ්ඩල නියෝජනය කර ඇත.

ඔහු දැනට ප්‍රධාන ගණකාධිකාරීවරයා ලෙස කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සිටින අතර ගණකාධිකරණ ක්ෂේත්‍රයේ වසර 34කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. දැනට ඔහු සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගම සහ සීමාසහිත ලංකා පොහොර සමාගම යන ආයතනයන් හි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරයි. ඊට අමතරව, ඔහු සමාගමේ විගණන සහ කළමනාකරණ කමිටුවේ ද සාමාජිකයෙකි.

අධ්‍යක්ෂ මණ්ඩලය



දිමුතු පැතුම් මහතා
අධ්‍යක්ෂ

දිමුතු පැතුම් මහතා 15.01.2020 සිට 31.03.2020 දක්වා සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් කටයුතු කර ඇත.



කෝසල ජයකොඩි මහතා
අධ්‍යක්ෂ

කෝසල ජයකොඩි මහතා වෘත්තියෙන් නීතිඥවරයෙකි. ඔහු අපරාධ නීතිය, සන්නාම ආරක්ෂණය සහ ව්‍යාජ නිවාරණය, පාරිභෝගික නීතිය, වාණිජ නීතිය, කම්කරු නීතිය සහ ප්‍රවාහනය පිළිබඳ විශේෂඥයෙකි. කෝසල මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇත. ඔහු 2011 වසරේ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ මඩුල්ලට කැඳවනු ලැබූ අතර වසර 10කට ආසන්න නීති කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ පැසසුම් ලද්දෙකි. කෝසල ජයකොඩි මහතාට නීතිය, ගිණුම්කරණය සහ මූල්‍ය, ප්‍රාග්ධන වෙළඳපල මෙහෙයුම් සහ කළමනාකරණ සේවා පිළිබඳ වසර ගණනාවක පළපුරුද්දක් ඇත.



එච්. කේ. සී. තාරුක අල්විස් මහතා
අධ්‍යක්ෂ



ඊ. ජී. ජී. එච්. මධුකා රණසිංහ මහත්මිය
අධ්‍යක්ෂ

චමත් අල්විස් මහතා කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයේ කීර්තිමත් ආදි සිසුවෙකි. ඔහුට දේශපාලනය සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ඇත. ඔහු දැනට එක්සත් රාජධානියේ බකිංහැම්ෂයර් නව විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධියේ අවසන් වසරේ ඉගෙනුම ලබයි.

දැනට නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. ඔහුට රාජ්‍ය කළමනාකරණය සහ දේශපාලනය පිළිබඳ දශකයකට වැඩි පළපුරුද්දක් ඇත.

මධුකා රණසිංහ මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ඇය වසර හතකට වැඩි කාලයක් මහා භාණ්ඩාගාරයේ සේවය කර ඇති අතර ජාතික මූල්‍ය සැලසුම් ක්‍රියාවලීන් පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇත. ඇය දැනට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය වන අතර ලක් පොහොර ආයතනයේ සහ රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතවරිය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය



එල්. ගැමුණු සමරවික්‍රම මහතා.
අධ්‍යක්ෂ



ඒ. එම්. චමිලා එස්. තිලකරත්න මහත්මිය
සමාගම් ලේකම්

ගැමුණු සමරවික්‍රම මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ද, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් පිරිස් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු 1993 සිට පුද්ගල කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු ද වේ. ඔහු තායිලන්තයෙන් මානව සම්පත් පුහුණුව, ඉන්දියානු, මැලේසියාව සහ සිංගප්පූරුව යන රටවලින් උපාය මාර්ග කළමනාකරණය සහ හයිද්‍රාබාද්හි සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ සහතික ද ලබා ඇත. 1987 සිට 1993 දක්වා පොල් වගා කිරීමේ මණ්ඩලයේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු 1993 දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පුද්ගල කළමනාකරු ලෙස සම්බන්ධ විය. පසුව මානව සම්පත් සහ සැපයුම් අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී ලෙස සේවයකර 2003 වසරේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට පත් විය. 2011 සිට 2012 දක්වා ඔහු 1999 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පුද්ගල කළමනාකරු තනතුර ද හෙබවූ අතර 1993 සිට 1999 දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයකු ද විය.

චමිලා තිලකරත්න මහත්මිය සීමාසහිත ලංකා පොහොර සමාගමේ සමාගම් ලේකම් ධුරය හොබවන අතර, සමාගමේ සහකාර කළමනාකරු (නීති) ලෙස 2009 වසරේ සිට කටයුතු කරයි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් ගෞරව සාමාර්ථය ලබා ගැනීමෙන් පසුව ඇය 2004 වසරේ දී නීතිඥ වෘත්තියට එක්විය. ඇය වෘත්තියෙන් නීතිඥවරියක සහ මහජන නොතාරිස්වරියකි. සමාගමේ සමස්ත නීතිමය කටයුතු ඇය විසින් මෙහෙයවන අතර ලක් පොහොර සමාගමේ කණ්ඩායමට එක්වීමට පෙර ඇය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවය කරන ලදී. එසේම ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජයීය විද්‍යා අධ්‍යන අංශයේ උපාධිධාරිනියකි.



ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



ආර්. ඒ. පී පෙරේරා මහතා
සාමාන්‍යාධිකාරී (වැඩ බලන) සහ
කළමනාකරු (බෙදාහැරීම)

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. එයට අමතරව ඔහු කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවන්ද හිමි කරගෙන ඇත. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ඵලදායීතාව පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කර ඇති ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් හදාරමින් සිටී. කාර්මික සෞඛ්‍යය සහ ආරක්ෂාව, ගිනි ආරක්ෂාව සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ නඩත්තු ක්ෂේත්‍ර පිළිබඳව විශේෂඥ වෘත්තීය මට්ටමක් දරයි.



බී. ඩී. එල්. කුමාරසිරි මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ (විශේෂ) උපාධියක් ලබා ඇති ඔහු ශ්‍රී ලංකාවේ මහජන මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේත්, වරලත් ව්‍යාපාර පරිපාලන ආයතනයේත්, ශ්‍රී ලංකා පොදු මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකාවේ පොදු මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ විශේෂ සාමාජිකත්වය දරයි. ඔහු පොදු ගිණුම් සහ මූල්‍ය ආයතනයෙන් මෙන්ම අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයෙන්ද අභ්‍යන්තර විගණනය සඳහා සහතික ලබා ඇත. ජාතික උපකරණ යන්ත්‍රසූත්‍ර පිළිබඳ සංවිධානයේ ගණකාධිකාරීවරයා සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ලෙස ඔහු සේවය කර ඇත.



ඉංජිනේරු ඩී. එම්. එන්. ඒ. දිසානායක මහතා
කළමනාකරු (කාර්මික)

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකු වන ඔහු ඒ ආයතනයේම ඉංජිනේරු අංශ කමිටුවේ සාමාජිකයකුද වෙයි.



ආර්. පී. එස්. බෝධිපාල මිය
කළමනාකාරිණී (අලෙවි සහ වෙළෙඳ)

ඇය සබරගමුව විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය (වැවිළි කළමනාකරණය) පිළිබඳ විද්‍යා විශේෂ උපාධියක් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. වැවිළි කර්මාන්ත කළමනාකරණය පිළිබඳ ඉහළ පළපුරුද්දක් ඇයට ඇත.



එම්. එල්. යූ. පෙරේරා මිය
කළමනාකාරිණී (රසායනාගාරය)

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා (ජීවවිද්‍යා) උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (MSc) ලබා ඇත. වර්ෂ 1996 දී සීමාසහිත ලංකා පොහොර සමාගමට සම්බන්ධ වූ ඇය පොහොර විශ්ලේෂණය සම්බන්ධ ඉහළ අත්දැකීම් සහිතව දීර්ඝ කාලයක් සේවය කර ඇත.



පී. පී. සමන් මහතා
වැඩ බලන කළමනාකරු
(ප්‍රසම්පාදන සහ ආනයන)

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් ලබා ඇත. දැනට ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රසම්පාදන සහ ගිවිසුම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරයි.

ජේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



එම්. ජී. ඩී. ගයනි මහත්මිය
වැඩ බලන කළමනාකරු (මුදල්)

එම්. ජී. ඩී. ගයනි මිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර, ඇය මරදානේ කාර්මික විද්‍යාලයෙන පිළිබඳ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව ද ලබා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය දරන ඇයට සමාගමෙහි වසර 26 ක පළපුරුද්දක් ඇත.



ටී. එස්. එස්. ධර්මබන්ධු මහත්මිය
වැඩ බලන කළමනාකරු
(පරිපාලන සහ මානව සම්පත්)

ටී. එස්. එස්. ධර්මබන්දු මිය කැලණිය විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් කම්කරු අධ්‍යයන (විශේෂ) උපාධියක් ද, ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් ද ලබා ඇත. සමාගමේ වසර 26 ක සේවා පළපුරුද්දක් ඇත.




විගණන හා
කළමනාකරණ කමිටුව
සභාපති හා
අධ්‍යක්ෂ මණ්ඩලය
HM 2.1
සාමාන්‍යාධිකාරී
HM 2.1
ප්‍රධාන අභ්‍යන්තර
විගණක
කළමණාකරු
(පරිපාලන හා
මානව සම්පත්)
කළමණාකරු
(මූදල්)
කළමණාකරු
(ප්‍රසම්පාදන)
කළමණාකරු
(අළෙවි හා
විකුණුම්)
MM 1.2
සහකාර / නියෝජ්‍ය
කළමණාකරු
(අභ්‍යන්තර විගණන)
සහකාර / නියෝජ්‍ය
කළමණාකරු
(මානව සම්පත් -
මෙහෙයුම් /පරිපාලන)
සහකාර / නියෝජ්‍ය
කළමණාකරු
(මූදල්)
සහකාර / නියෝජ්‍ය
කළමණාකරු
(ප්‍රසම්පාදන හා ආනයන)
සහකාර / නියෝජ්‍ය
කළමනාකරු විකුණුම් මෙහෙයුම් /
විකුණුම් හා අලෙවි ප්‍රවර්ධන
ප්‍රාදේශිය අලෙවි කළමනාකරු
JM 1.1
විගණන
විධායක
මානව සම්පත්
විධායක /
ප්‍රවාහන නිළධාරී
සහකාර
ගණකාධිකාරී
ප්‍රසම්පාදන /
ආනයන නිලධාරී
අලෙවි නිලධාරී /
දිස්ත්‍රික් අලෙවි විධායක
MA 1.1 / 2.1
කළමනාකරණය
සහකාර
(තාක්ෂණික නොවන)
කළමනාකරණය
සහකාර
(තාක්ෂණික නොවන)
කළමනාකරණය
සහකාර
(තාක්ෂණික නොවන)
කළමනාකරණය
සහකාර
(තාක්ෂණික නොවන)
කළමනාකරණය
සහකාර
(තාක්ෂණික නොවන)
PL - 3
ප්‍රාථමික
ශිල්පීය
PL - 2
ප්‍රාථමික
අර්ධ ශිල්පීය
PL - 1
ප්‍රාථමික ශිල්පීය
නොවන
ප්‍රාථමික ශිල්පීය
නොවන
ප්‍රාථමික ශිල්පීය
නොවන
ප්‍රාථමික ශිල්පීය
නොවන
ප්‍රාථමික ශිල්පීය
නොවන

සංවිධානාත්මක ව්‍යුහය





47 දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය...

සීමාසහිත ලංකා පොහොර සමාගම

දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය

උතුරු පළාත
කොණ්ඩවිල්
කිළිනොච්චි
වරණි
ඕලුමඩු
මුරන්කන්

උතුරු මැද පළාත
මැදවච්චිය
හොරොව්පතාන
කිරලෝගම
නොච්චියාගම
හිඟුරක්ගොඩ
වැලිකන්ද
පොළොන්නරුව

වයඹ පළාත
ආණමඩුව
මහව
කුරුණෑගල
නාත්තණ්ඩිය

මධ්‍යම පළාත
දඹුල්ල
නාගොල්ල
මාතලේ
ගම්පොළ
රිකිල්ලගස්කඩ
නුවරඑළිය

නැගෙනහිර පළාත
ත්‍රිකුණාමලය
කන්තලේ
මඩකලපුව
දෙහිඅත්තකණ්ඩිය
අම්පාර
පොතුවිල්

බස්නාහිර පළාත
හුණුපිටිය
දොඩංගොඩ
මතුගම
පැලවත්ත

සබරගමුව පළාත
කෑගල්ල
කුරුවිට
ඇඹිලිපිටිය

ඌව පළාත
මහියංගනය
බිඹිල
බදුල්ල
මොණරාගල
වැලිමඩ

දකුණු පළාත
වීරවිල
දෙහිගහලන්ද
බට-අත
මැදවියන්ගොඩ
අකුරැස්ස
කොග්ගල
සූරියවැව





කළමනාකරන සමාලෝචනය සහ විශ්ලේෂණය

කෘෂිකාර්මික අංශය කෙරෙහි අවධානය යොමු කරන ලද දළ ආර්ථික විශ්ලේෂණය:

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, 2018 වසරේ අඩු උද්ධමන පරිසරයක් මධ්‍යයේ සැබෑ ආර්ථික ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථ ප්‍රසාරණයක් සමඟ, ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීය සහ දේශීය කැලඹීම්වලට ගොදුරු වීමේ අවදානම වැඩි වැඩියෙන් දෘශ්‍යමාන විය. පෙර වසරේ පැවති සියයට 3.4 ට සාපේක්ෂව, 2018 වසරේ සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය වාර්තා වූයේ 3.2ක් ලෙසිනි. සියයට 4.7 කින් ප්‍රසාරණය වූ සේවා ක්‍රියාකාරකම් සහ සියයට 4.8 ක පමණ වර්ධනයක් වාර්තා කළ කෘෂිකාර්මික කටයුතු ප්‍රකෘතිමත් වීම මෙම වර්ධනයට බොහෝ දුරට සහාය විය. ඉදිකිරීම් කටයුතු අඩාල වීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන වශයෙන් වසර තුළ කර්මාන්ත ක්‍රියාකාරකම් සියයට 0.9 දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය

වියදම් ප්‍රවේශයට අනුව, පරිභෝජන වියදම් සහ ආයෝජන වියදම් යන දෙකම වර්ධනයට උපකාරී විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආයෝජනය පෙර වසරේ සියයට 28.8 ට සාපේක්ෂව, 2018 දී සියයට 28.6 ක් වූ අතර, හිඟය පිරවීම සඳහා බාහිර සම්පත් මත යැපීම වැඩි වීම පෙන්නුම් කරමින් වසරේ ඉතුරුම්-ආයෝජන පරතරය පුළුල් විය. සමස්ත

ශ්‍රී ලංකා ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 88.9ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2018 වසරේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4,102ක් ලෙස වාර්තා වූ අතර එය පෙර වසරට වඩා සුළු වශයෙන් අඩු වීමකි. ආර්ථික ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථ වර්ධනය මධ්‍යයේ, විරැකියා අනුපාතයේ සුළු වැඩිවීමක් සහ ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතයේ පහත වැටීමක් වර්ෂය තුළ නිරීක්ෂණය කරන ලදී.



විශේෂයෙන් 2018 අප්‍රේල් මැද සිට විවිධ බලපෑම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාව ද සැලකිය යුතු ආර්ථික පසුබෑමකට ලක් විය. දේශපාලන අවිනිශ්චිතතාවයන් සහ වසරේ සිව්වන කාර්තුවේ දී රටේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම පහත වැටීමෙන් පසුව ගැටළු තීව්‍ර විය. මූල්‍යමය වශයෙන් එය රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට වෙළඳ හිඟය ඩොලර් බිලියන 10 ඉක්මවීමත් සමඟ සමස්ත වශයෙන් පරිහානිදායක වසරක් විය. 2018 වර්ෂය තුළ පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ආහාර මිල ගණන් බොහෝ දුරට පහත වැටුණු ආහාර කාණ්ඩයේ මිල චලනයන්ට අනුකූලව මූලික උද්ධමනය විශාල වශයෙන් උච්චාවචනය විය.

COVID-19 වසංගතය සමාජයේ සෑම අංශයකටම අසාමාන්‍ය පීඩනයක් ඇති කළ අතර ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ ගැටළු කෙරෙහි වැඩි අවධානයක් යොමු නොවීය. කෘෂිකර්ම අංශය 2.4% කින් හැකිලී ගියේ ය. කෘෂිකාර්මික අංශයෙන්, මසුන් ඇල්ලීම සහ මුහුදු ජලජීවී වගාව, වන වගාව සහ දැව කැපීමේ ක්‍රියාකාරකම් වසංගතය හේතුවෙන් ඇති වූ බාධාවන් නිසා ම කැපී පෙනෙන ලෙස අවම වී ගිය අතර, 2019 වසරේ පැවති වියළි කාලගුණික තත්ත්වයන්ගේ පසුගාමී බලපෑම් හේතුවෙන් පලතුරු නිෂ්පාදනය ද අඩු වී ගියේය. අනෙක් අතට, අනෙකුත් එළවළු, සහල්, පලතුරු සහ ධාන්‍ය වර්ග වගා කිරීමේ අංශ, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය සහාය ඇතිව 2020 වසර තුළ සාර්ථක ප්‍රගතියක් වාර්තා කළේය.

බහුවිධ සමාජ ආර්ථික අර්බුද හේතුවෙන් සැලකිය යුතු කඩාවැටීමක් තිබියදීත්, සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම් ප්‍රමුඛතාවයක් පැවතුනි. කෙසේ වෙතත්, ඵලදායිතාව අඩු මට්ටමක පැවතීම ගොවි ප්‍රජාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපා ඇත. එබැවින්, ආර්ථිකය වැඩිවර්ධනය වීම, නවීන තාක්ෂණය

පදනම් කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, නවීන කෘෂිකාර්මික පිළිවෙත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා සුහුරු ගොවිතැන් තාක්ෂණ ක්‍රම අනුගමනය කිරීම සහ ගොවීන් සැපයුම් දාමයට කාර්යක්ෂමව සම්බන්ධ කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති යෙදවීම වැනි ක්‍රමෝපායයන් අංශයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා හේතුපාදක වේ.

විකුණුම් සාරාංශය:

2019. 04 01 සිට 2020. 03. 31 දක්වා බෝග අලෙවිය		
පොහොර වර්ගය	**අලෙවිය මෙට්‍රික් ටොන්**	**%**
සෘජු	13976.231	63%
පොල්	801.165	4%
තේ	1536.133	7%
රබර්	661.025	3%
එලවළු	1830.035	8%
පලතුරු	772.659	3.5%
මල්	11.556	0.5%
ආනයනය	302.006	1%
වෙනත් ආහාර බෝග	1992.566	9%
කාබනික	176.329	1%
එකතුව	**22059.705**	**100%**

වී සහනාධාර, වෙනත් භෝග, සහනාධාර නොවන, මිශ්‍ර සහ කාබනික පොහොර අලෙවිය 2019.04.01 සිට 2020.03.31 දක්වා						
මාසය	**යූරියා**	**TSP**	**MOP**	**වී අලෙවිය මෙට්‍රික් ටොන්**	**සහනාධාර නොවන, මිශ්‍ර සහ කාබනික පොහොර අලෙවිය**	**මුළු විකුණුම් මෙට්‍රික් ටොන්**
අප්‍රේල්	11662.150	3165.550	3180.150	18007.850	289.527	18297.377
මැයි	21941.200	5040.900	6066.950	33049.050	2467.708	35516.758
ජූනි	4396.200	933.600	1457.800	6787.600	4359.437	11147.037
ජූලි	733.150	205.650	270.800	1209.600	1330.928	2540.528
අගෝස්තු	315.000	76.800	94.200	486.000	745.960	1231.960
සැප්තැම්බර්	665.300	238.250	251.850	1155.400	1742.233	2897.633
ඔක්තෝම්බර්	17947.900	4589.450	5101.500	27638.850	4177.899	31816.749
නොවැම්බර්	39335.600	8995.700	10918.750	59250.050	1563.884	60813.934
දෙසැම්බර්	17700.550	4151.200	4871.597	26723.347	1789.970	28513.317
ජනවාරි	5113.750	1002.800	1022.084	7138.634	1371.502	8510.136
පෙබරවාරි	1755.500	355.500	471.850	2582.850	1130.671	3713.521
මාර්තු	1449.750	462.100	394.250	2306.100	1089.986	3396.086
එකතුව	**123016.050**	**29217.500**	**34101.781**	**186335.331**	**22059.705**	**208395.036**

සහනාධාර, වෙනත් භෝග, සහනාධාර නොවන, මිශ්‍ර සහ කාබනික පොහොර විකුණුම් ගිම්හානය 2019.04.01 සිට 2020.03.31 දක්වා							
	කෝටා වෙන්කිරීම			**ප්‍රගතිය**			**ප්‍රතිශතය**
වී සහනාධාරය	**යූරියා**	**TSP**	**MOP**	**යූරියා**	**TSP**	**MOP**	**(%)**
	153245.000	37587.000	45660.000	123016.050	29217.500	34101.781	79%
එකතුව			**27000**			**22059.705**	**82%**



මූල්‍ය සමාලෝචනය

ආදායම්

සමාගමේ ආදායම සමාලෝචිත වර්ෂය තුළ වී සහ අනෙකුත් භෝග සඳහා පොහොර අලෙවියෙන් බිලියන 2.1 ක් වූ අතර එය වසරින් වසර 12% ක වැඩිවීමකි.



දළ ලාභය

සමාගමේ දළ ලාභය සමාලෝචිත වර්ෂය තුළ මිලියන 268 ක් වූ අතර එය වසරින් වසර 42% ක වැඩිවීමකි. පොහොර සහනාධාරය යළි ස්ථාපිත කිරීම දළ ලාභය ඉහළ යාමට ප්‍රධාන හේතුව විය.



පරිපාලන වියදම්

පරිපාලන වියදම් ස්ථාවර කිරීමට සමාගම උපරිම උත්සාහයක් ගත්තද, සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන වියදම් රුපියල් 536 සිට රුපියල් 550 දක්වා 3% කින් වැඩි විය.



බෙදාහැරීමේ වියදම්

සමාගමේ බෙදාහැරීමේ වියදම් වසරකට රුපියල් මිලියන 42 සිට රුපියල් මිලියන 21 දක්වා 50% කින් පහත වැටුණු අතර, ප්‍රධාන වශයෙන් ණයකරුවන්ගෙන් රුපියල් මිලියන 19 ක් වූ ආදායම ඉවත් කිරීම හේතු විය.



මූල්‍ය ආදායම සහ වියදම්

සමාගමේ ආදායම සැලකිල්ලට ගනිමින් සමාලෝචිත වර්ෂයේදී එය රුපියල් මිලියන 346 දක්වා පහත වැටී ඇත. වියදම් රුපියල් 63 දක්වා වැඩි වී ඇත.



බදු වලට පෙර ලාභය

බදු ගෙවීමට පෙර ලාභය වසරකට රුපියල් මිලියන 69 කින් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව සමාගමේ ලාභය අන්‍යෝන්‍ය වශයෙන් වැඩි වූ පොහොර සහනාධාරය නැවත හඳුන්වා දීමයි.



බදු

රුපියල් මිලියන 38 ක වෙනස්වන බදු පිරිවැය ඇතුළත්ව ආදායම් බදු පිරිවැයට ඇතුළත්ය. වසරට රුපියල් මිලියන 64 අඩුවීමකි.



කොටසකට ඉපැයීම්

වර්ෂය සඳහා කොටසක ඉපැයීම ශ්‍රී ලංකා මුදලින් රු. 1. 95කි.



කොටසකට ලාභාංශ

මූල්‍ය වර්ෂයේ කොටසකට ලාභාංශය රුපියල් 0.59කි.



වත්කම් මත ප්‍රතිලාභ

සමාලෝචිත වර්ෂය තුළ මුළු වත්කම් මත 8.28%ක ප්‍රතිලාභයක් උපයා ගැනීමට සමාගමට හැකි විය.



කොටස් මත ප්‍රතිලාභ

සමාලෝචිත වර්ෂය තුළ කොටස් මත 0.34% ක ප්‍රතිලාභයක් පවත්වා ගෙන යාමට සමාගමට හැකි විය.



ආයතනික පාලනය

මානව සම්පත් කළමනාකරණයේ සම්මත ක්‍රියාවලියක් මගින් පාලිත ශක්තිමත් ආයතනික වටිනාකම් සංග්‍රහයක් සහ ධුරාවලියක් සමඟින් පාලනය ආයතනගත කර ඇත.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ ආයතනික පාලනය ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාමේ සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. සමාගමේ ආයතනික පාලනයේ යාන්ත්‍රණය සියලු පාර්ශ්වයන්ට විකඟතාවක් මත සහතික කර ඇත. ආයතනික පාලනය පහත සඳහන් රෙගුලාසි, නීති සහ ආඥාපනත්වලට අනුකූලව සිදු කෙරේ.

1. 2007 අංක 07 දරන සමාගම් පනත
2. යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාරික මාර්ගෝපදේශය
3. යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති ලේඛනය

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන්නේ රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණයක් සහතික කිරීමයි. ආයතනික සම්පත් ආරක්ෂා කිරීම, නිසි ගිණුම් පවත්වාගෙන යාම, නිවැරදි වාර්තා ප්‍රසම්පාදනය සහතික කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවලට බැඳී සිටීමෙන් මෙය සාර්ථක ලෙස සපුරාගත හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයට උපාය මාර්ගික ඉලක්ක ඇති බවත්, උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා සමාගම ක්‍රියා කරන බවත් සහතික කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය සඳහා ඵලදායී පද්ධතියක් පවතින බව, කළමනාකරණ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහ සම්පත් සහ වත්කම් ඵලදායී ලෙස භාවිතා කරන බව ක්‍රමානුකූලව අධීක්ෂණය කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව කාර්ය සාධනය ඇගයීමට ලක් කරනු ඇත.

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය, උනන්දුව දක්වන පාර්ශ්වයන්ට මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රමාණවත් විස්තර සහ ක්‍රමානුකූල පදනමක් මත සපයනු ඇත.

විගණන හා අවදානම් කළමනාකරණ කමිටු පත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. සමාගම විසින් සම්මත පාලන මාර්ගෝපදේශයක්, ආචාර ධර්ම පද්ධතියක් සහ ආයතනික පාලනය පිළිබඳ උපාය මාර්ග හඳුන්වා දී ඇත. මෙහෙයුම් සහ හිමිකාරිත්වය සම්බන්ධයෙන් කිසිදු ගැටුමක් ඇති නොවන පරිදි රාජ්‍ය චක්‍රලේඛවලට අනුව සියලුම ව්‍යවස්ථා සහ මාර්ගෝපදේශ අනුගමනය කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම

රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන විට එම පත්වීම් සම්මත ප්‍රමිතියෙන්, තරගකාරී බවින් යුතුව සහ වගකීම් සහගත ලෙස සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්, යුතුකම් සහ වගකීම් බලයලත් පුද්ගලයා විසින් පත්වීම් ලිපියේ පැහැදිලිව දක්වා ඇත.

පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයට සමාගමේ උපාය මාර්ගික ඉලක්ක සහ ආයතනික ඉලක්ක, සමාගමේ ආයතනික පාලනය, කළමනාකරණය මෙන් ම පරිපාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි සම්බන්ධ වගකීම් පැවරෙනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2018/19 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 11ක් පවත්වා ඇති අතර කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාලෝචිත හා අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ දීමනා

රජය විසින් සැලසුම් කරන ලද ප්‍රතිපත්ති සහ දීමනා පරිමාණයන් මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ දීමනා ගෙවනු ලැබේ. මෙම දීමනා පිළිබඳ තීරණවලට අධ්‍යක්ෂවරුන් මැදිහත් නොවනු ඇත.

සභාපති

සමස්ත ආයතනික ව්‍යුහය සඳහා සභාපතිවරයාගේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර ඔහු ආයතනය නිවැරැදි දිශාවට යොමු කරනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ආයතනික පාලනය පවත්වාගෙන යාම, සෑම අධ්‍යක්ෂවරයෙකුටම සමානව සැලකීම, වගකීම් නිවැරදි ආකාරයෙන් බෙදා හැරීම, බලය සහ අධිකාරිය තුලනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අඛණ්ඩව පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සහතික කිරීම යන කරුණු සම්බන්ධ සුමට කාර්යයන් සභාපතිවරයා විසින් සහතික කරනු ඇත. ඔහු තම විශේෂඥ දැනුම ඇති ක්ෂේත්‍රවලට දායක වෙයි. සභාපතිවරයා ආයතනික මෙහෙයුම්වලට ක්‍රියාකාරිව සම්බන්ධ වීමෙන් ඈත් වී අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කරන අතරම පෙරගමන්කරුවෙකුගේ භූමිකාව ඉටු කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ වාර්ෂික මහා සභා රැස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට අදාළ නියමයන් සහ රෙගුලාසි පිළිබඳව දැනුම්වත් කිරීම යනාදී කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වෘත්තීය සුදුසුකම් ලත් ලේකම්වරයා වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සම්බන්ධ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නියමිත වේලාවට බෙදා හැරීම ලේකම්වරයා සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ වගකීම්, නියමයන් සහ කොන්දේසි සම්බන්ධයෙන් මගපෙන්වීම සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට උපදෙස් දීමත් අදාළ සහාය ලබාදීමත් ඔහුගේ වගකීම් වෙයි.

සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

සමාගමේ ව්‍යාපාර කළමනාකරණයේ වගකීම සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දරයි. ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔවුන් වගකිව යුතුය. සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ සලකා බැලීම සහ තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් සපයනු ලැබේ.

ඔවුන් සමාගමේ ඵලදායී කළමනාකරණය සඳහා පරිපාලන හා නියාමන පද්ධති පවත්වාගෙන යන අතරම සමාගමේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම්, සැලසුම් සහ අයවැය සකස් කරයි. සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා දීමනා තීරණය කිරීම සඳහා දීමනා ගෙවීමේ යෝජනාවේ උපදෙස් අනුගමනය කෙරේ.

මූල්‍යය වාර්තා

සමාගමේ වාර්ෂික තත්ත්වය සහ කාර්ය සාධනය නිරවද්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන වාර්ෂික මූල්‍ය වාර්තා සකස් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. මූල්‍ය වාර්තා මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය වන විටෙක වැදගත් තොරතුරු සම්පූර්ණයෙන්ම හෙළි කරමින් සාමාන්‍යාධිකාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය තම වගකීම් ඵලදායී ලෙස ඉටු කළ යුතු ය.

වාර්ෂික විගණනය

සමාගමේ වාර්ෂික විගණනය සිදු කරනු ලබන්නේ විගණකාධිපති / භාණ්ඩාගාරය විසින් වරලත් ගණකාධිකාරී ලැයිස්තුවෙන් නිර්දේශ කරනු ලබන සහ විගණන සහ කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බාහිර විගණකවරයෙකු විසිනි. වාර්ෂික විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමැතිය සඳහා වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ. විගණන ක්‍රියාවලියේ දී බාහිර විගණකවරුන් විසින් අපක්ෂපාතී සහ ස්වාධීන තීරණ අපකීර්තියට පත් කළ හැකි උපදේශන හෝ වෙනත් සේවාවන් සැපයීමෙන් වලක්වනු ලබන අතර සෑම වසර 05 කට වරක් බාහිර විගණකවරුන් වෙනස් කරනු ලැබේ.

විගණන සහ අවදානම් කළමනාකරණ කමිටුව

සමාගමේ විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව පරිපාලන කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වෙමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම කමිටුව භාණ්ඩාගාරයේ මූල්‍යමය වශයෙන් සුදුසුකම් ලත් නියෝජිතයෙකු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙම නියෝජිතයා විගණන කමිටුවේ සභාපති තනතුර දරයි.



අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

සංවිධානයක හෙළිදරව් වූ අවදානම හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම අවදානම් කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ. පාඩු වළක්වා ගැනීමට සහ පාඩුවකින් සිදුවන බලපෑම අවම කිරීමට සංවිධානය ඵලදායී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරන බව නිසැක ය. අවදානම් කළමනාකරණය අවදානම් හඳුනාගැනීම සඳහා පැහැදිලි සහ ව්‍යුහගත මාර්ගයක් සපයයි. සියලුම අවදානම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමෙන්, ආයතනයකට එම අවදානම් අවම කර ගැනීමට අවශ්‍ය පියවරයන් ඇගයීමට හා ප්‍රමුඛත්වය දී ගත හැකිය.

නොසැලකිල්ල හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම සහ වෙනස් කිරීම සඳහා සමාගම ක්ෂණිකව ස්ථාපිත ක්‍රියාවලියක් අනුගමනය කර ඇත. අපගේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අවදානම් පිළිබඳ සම්පූර්ණ අවධානය මත පදනම්ව අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් සඳහා උපකාර කිරීමයි.

අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම යනු සිදු කළ යුතු පළමු හා ප්‍රධානතම දේ වේ. එයින් පසු හඳුනාගත් අවදානම් වළක්වා ගැනීමට, අවම කිරීමට සහ වෙනස් කිරීමට උපාය මාර්ග භාවිත කළ හැකි වීවා පසුව සැලසුම් කර ඇත. සමාගමේ මෙහෙයුම් කෙරෙහි අවධානය යොමු කරන ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් තිබීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.

ප්‍රධාන අවදානම් සාධක

අපගේ සමාගම තුළ අවදානම් සාධක කිහිපයක් ඇති අතර මෙහෙයුම් ක්‍රමවේදය තුළ අවිනිශ්චිතතාවයක් පවතී. සමාගම මුහුණ දෙන එම අවදානම් සාධක සහ වීවා අවම කිරීමට ගෙන ඇති පියවර පසුව සාකච්ඡා කෙරේ.

උපාය මාර්ගික අවදානම්

අපගේ උපාය මාර්ගික අරමුණු සහ භාවිතයට නොගත් අවස්ථාවන් තුළ තැන්පත් වී ඇති අවිනිශ්චිතතාවයන් නිසා ඇතිවන අවදානම් උපාය මාර්ගික අවදානම් ලෙස හැඳින්වේ. මෙම ආකාරයේ අවදානම් පැන නගින්නේ ප්‍රධාන වශයෙන් සංවිධානයේ අරමුණු අනුව අධ්‍යක්ෂවරුන් විසින් ගනු ලබන ප්‍රධාන තීරණ මගිනි.

උපායමාර්ගික අවදානම පිටුපස ඇති ප්‍රධාන සංකල්පය වන්නේ අපගේ යෝජිත ආයතනික ඉලක්ක සපුරා ගැනීමට අසමත් වීමයි. මෙය සැලකිල්ලට ගනිමින්

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණ කණ්ඩායම විසින් පස් අවුරුදු අනාගත සංයුක්ත සැලැස්ම, වසර 3 ක සක්‍රීය සැලැස්ම සහ වාර්ෂික සැලැස්ම පදනම් කරගෙන ක්‍රමානුකූල පශ්චාත් සමාලෝචන සිදු කරනු ලබයි.

ව්‍යාපාර අවදානම්

මෙම අවදානමට භාණ්ඩ නිෂ්පාදනය, අලෙවිකරණය සහ අලෙවිය සම්බන්ධ අවදානම්, නිෂ්පාදන පිරිවැයට බලපාන ආර්ථික අවදානම් සහ තාක්ෂණික පරිසරයේ වෙනස්වීම් මෙන් ම පාරිභෝගිකයන්ගේ තේරීම් හේතුවෙන් ඇතිවන අවදානම් ඇතුළත් වේ. අපගේ ව්‍යාපාරයට සම්බන්ධ ප්‍රධාන අභ්‍යන්තර අවදානම් වනුයේ පවතින නිෂ්පාදන සමඟ කටයුතු කිරීමට ඇති නොහැකියාව සහ නව නිෂ්පාදන වර්ධනයන් හා සම්බන්ධ අවදානම් ය. පවතින නිෂ්පාදන සමඟ ගනුදෙනු කිරීමට ඇති නොහැකියාව සිව් වැදෑරුම් ය. එනම්, පාරිභෝගිකයාගේ අවශ්‍යතා, තාක්ෂණය, කාර්මික සහ ආර්ථික කරුණු මෙන් ම නෛතික අවශ්‍යතා තේරුම් ගැනීමට නොහැකි වීමයි.

සමාගම ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය සහ ඔවුන්ගේ අවශ්‍යතාවල වෙනස්කම් පිළිබඳව තක්සේරු කිරීම් පිළිබඳව ක්‍රමානුකූල සමීක්ෂණ පවත්වයි. සමාගම තුළ සිදු විය හැකි රෙගුලාසි සහ නිර්දේශවල අනාගත වෙනස්කම් අවබෝධ කර ගැනීම සඳහා, එය පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි ප්‍රමුඛ පෙළේ නෛතික රාජ්‍ය මණ්ඩල සහ සංවිධාන සමඟ සමීපව කටයුතු කරයි.

නව නිෂ්පාදන හඳුන්වා දෙන්නේ වෙළෙඳපොළ සහ පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ සම්පූර්ණ අධ්‍යයනයකින් පසුවය.

ව්‍යාපාරික නොවන අවදානම්

මෙම අවදානම ප්‍රධාන ව්‍යාපාරයට සම්බන්ධ නොවන අතර මූලික වශයෙන් දිගුකාලීන මූල්‍ය කටයුතු හා සම්බන්ධ වේ. අනාගත වසර 5 සඳහා සංයුක්ත සැලැස්ම සහ වසර 3 සඳහා සකස් කරන ලද සක්‍රීය සැලැස්ම හරහා සමාගමේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා කල් ඇතිව තක්සේරු කිරීමෙන් මෙම මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මූලාශ්‍ර හඳුනා ගැනේ. සැලසුම්ගත වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලැස්ම මගින් සමාගමට ඇතුළු වන සහ පිටතට යන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම කර ඇති අතර කිසිදු ක්ෂණික මුදල් අවශ්‍යතාවයක් කිසිදා මතු නොවේ.

මෙහෙයුම් අවදානම්

මෙමඟින් සංවිධානයේ බිම් මට්ටමේ සිදුවෙමින් පවතින දේ පිළිබඳ අදහසක් ලබා ගත හැකිය. මෙහෙයුම් අවදානම් ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර සම්පත්, පද්ධති, ක්‍රියාවලි සහ සංවිධානයේ සේවකයින් සමඟ සෘජුව ම සම්බන්ධ වේ. ගබඩා සහ යන්ත්‍ර සූත්‍රවල දුර්වල ක්‍රියාකාරිත්වය, සේවකයින් සඳහා වන පිරිවැය සහ අයහපත් කාලගුණික තත්ත්වයන් වැනි ස්වභාවික අවස්ථා ද මෙයට ඇතුළත් වේ.

- ප්‍රමාණවත් ගිනි නිවන උපකරණ සහ අනතුරු ඇඟවීම් ඇතුළු විශාල ගිනි ආරක්ෂණ පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යනු ලැබේ.
- ගින්නක් හේතුවෙන් සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා සමාගම විසින් ගිනි රක්ෂණ ආවරණයක් සහ අතිශය සංවේදී රසායනාගාර උපකරණ සඳහා අතිරේක ඉලෙක්ට්‍රොනික රක්ෂණයක් මිලදී ගෙන ඇත.
- වංචා සහ දූෂණයේ බලපෑම අවම කිරීම සඳහා ජංගම මුදල් සහ මුදල් සේප්පු සඳහා රක්ෂණයක් මිලදී ගෙන ඇත.
- එක් එක් ආනයනික භාණ්ඩ නැව්ගත කිරීම් සඳහා ප්‍රමාණවත් සමුද්‍ර රක්ෂණ සහතික මිලදී ගෙන ඇත.
- මුදල් සහ මුදල් නොවන අභිප්‍රේරණ සේවක වැඩසටහන් හේතුවෙන් සමාගමේ සේවකයින් සඳහා වන පිරිවැය අඩු මට්ටමක පවතී.

මුදල් අවදානම්

සමාගමට, මුදල් උපකරණ භාවිතා කිරීමේදී ණය අවදානමක්, ද්‍රවශීලතා අවදානමක් සහ වෙළඳපොළ අවදානමක් ඇතුළු මුදල් අවදානමක් ඇත.

ණය අවදානම

අදාළ පාර්ශ්වයන් සමාගමෙහි එකඟ වූ වගකීම්වලට මුහුණ දීමට අපොහොසත් වුවහොත්, ණය අවදානම යනු සමාගමේ මූල්‍ය අලාභය හා සම්බන්ධ අවදානමයි. ණය අවදානම පැන නගින්නේ ප්‍රධාන වශයෙන් ණය මත විකුණුම් සහ අවදානම් අවම කිරීම සඳහා, මූල්‍ය සංවිධාන සමඟ තැන්පතු කිරීම හේතුවෙනි.

- බෙදාහරින්නන් පත් කිරීමට පෙර, ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවන්, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය කළමනාකරු සහ සමාගමේ නීති නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් එක් එක් පුද්ගලයාගේ හැකියාව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ..

- ණය පහසුකම් නිකුත් කිරීමට පෙර බෙදාහරින්නන් සහ ඊට අනුරූප පාර්ශවයන්ගෙන් බැංකු ඇපකර ලබා ගනී.

- බෙදාහරින්නන් සහ අදාළ පාර්ශ්වයන් සඳහා ණය විශ්ලේෂණවලදී සිදු කරන ලද නිගමනවලට අනුව ණය කාල සීමාවන් සහ අගැයීම් සීමාවන් දක්වා ඇත.

ද්‍රවශීලතා අවදානම

මූල්‍ය වගකීම්වලට මුහුණ දීමට සමාගමට ඇති නොහැකියාව ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්වේ. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සමාගමේ පිළිවෙත වන්නේ සාමාන්‍ය සහ අනපේක්ෂිත ලෙස පැන නඟින වගකීම්වලට මුහුණ දීමට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ඇති බව සහතික කිරීමයි. ඉදිරි වසර පහ සඳහා සංයුක්ත සැලැස්ම සහ ඉදිරි වසර තුන සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මඟින්, සමාගමෙන් පිටවන මුදල් ප්‍රවාහයේ පූර්ව තක්සේරුව, මෙම මුදල් ප්‍රවාහයේ ප්‍රභවයන් සහ ඉන් පිටතට එන මුදල් ප්‍රවාහයන් හඳුනා ගැනීමට උපකාරී වේ. සමාගම එකී මුදල් සංසරණයන් කාර්යක්ෂම කර ඇති අතර වාර්ෂික වාර්තාව සහ ප්‍රසම්පාදන සැලැස්ම මගින් සියලු මූල්‍ය වගකීම් පියවීමට පහසුකම් සපයා ඇත.

වෙළෙඳපොළ අවදානම

උච්චාවචනයේ පොලී අනුපාත (පොලී අවදානම) උච්චාවචනය වීම හේතුවෙන් වෙළෙඳපොළ මිලෙහි උච්චාවචනය විදේශ විනිමය (විනිමය මුදල් අවදානම) වෙළෙඳපොළ අවදානම ලෙස හැඳින්වේ, එය සමාගමේ ආදායමට සහ මූල්‍ය උපකරණ නඩත්තු කිරීමේ හැකියාවට බලපෑ හැකිය.

විනිමය මුදල් අවදානම

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය උච්චාවචනය වීම නිසා ඇති වන අවදානම විසින් සමාගම විනිමය මුදල් අවදානමකට ලක් කරයි.

පොලී අවදානම

ස්ථාවර පොලී අනුපාතයක් යටතේ ණයට මිලදී ගැනීම් සඳහා වෙළෙඳපොළ පොලී අනුපාත උච්චාවචනය වීම සහ බැංකු තැන්පතු සමඟ පොලී රඳවා තබා ගැනීම පොලී අවදානම ලෙස හැඳින්වේ.

නියාමන අවදානම

පොහොර ආනයනය, නිෂ්පාදනය, බෙදාහැරීම සහ පරිභෝජනය සම්බන්ධයෙන් වන රාජ්‍ය රෙගුලාසි සහ පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය වැනි රාජ්‍ය ආයතන විසින් බලාත්මක කරන නිර්දේශ වෙනස් කළ විට ඊට අනුකූලව කටයුතු කිරීමේ බලය සමාගමට හිමිවේ. නියාමන සැකසුමෙහි සිදුවිය හැකි ඕනෑම වෙනසක් හඳුනාගැනීමේදී, සමාගම මෙම සංවිධාන සමඟ සමීපව කටයුතු කරයි.

කෙසේ වෙතත්, අවදානම් සාධක මෙම ලැයිස්තුවට සීමා නොවන අතර, සමාගම සිය මෙහෙයුම්වලට බලපෑම් කළ හැකි එවැනි වෙනස්කම් පිළිබඳව ඉතා සුපරීක්ෂාකාරී වේ.

මානව සම්පත් කළමනාකරණ වාර්තාව

යහපත් භාවිතයන් සහ සේවක ප්‍රතිපත්ති

සාප්පු හා කාර්යාල සේවක පනත, පඩිපාලක සභා ආඥාපනත, භාණ්ඩාගාරය හා රේඛීය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන් සහ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම කම්කරු නීතිවලට අනුකූලව අපගේ මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග නිසි ලෙස සකස් කර ඇත. රජයේ කාර්යයය පටිපාටිය සහ ආයතන සංග්‍රහයට අනුකූලව, සමාගම සිය ආයතනික ව්‍යුහය නිර්මාණය කිරීමේදී, නිසි කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ප්‍රශස්ත අන්දමින් ක්‍රියාත්මක කරන අතරම එහි මානව සම්පත් කළමනාකරණය ප්‍රශස්ත කිරීමට උත්සාහ කරයි. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ස්ථාපිත කර ඇති ප්‍රමිතීන් සහ නියෝග අනුව උසස්වීම් ලබා දීම සහ වේතන පැකේජ ස්ථාපිත කිරීම සිදු කෙරේ.

සේවක ප්‍රතිලාභ සැලැස්ම

රාජ්‍ය නියමයන්ට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දළ වැටුපෙන් 15%ක් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දළ වැටුපෙන් 3%ක් දායක කෙරෙයි.

ප්‍රතිලාභ සැලැස්ම හඳුන්වාදීම

සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් සෑම වසරකම ගණනය කරනු ලබන අතර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන සෑම සේවකයෙකුගේම සේවයට බඳවාගත් වර්ෂයේ සිට ගණනය කෙරේ.

සේවක අභිප්‍රේරණය

සාමකාමී සේවා පරිසරයක් නිර්මාණය කිරීම, පහසුකම් වැඩිදියුණු කිරීම, ආතතිය අවම කිරීම සහ සමාගමේ දෛනික ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳ ශක්තිමත් හැඟීමක් සේවකයින්ට ලබා දීමෙන් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව උපරිම කිරීමට තම කාර්ය මණ්ඩලය පෙළඹවීම කෙරෙහි සමාගම දැඩි අවධානයක් යොමු කරයි.

මූල්‍ය ප්‍රතිලාභ

- වාර්ෂික දිරිගැන්වීමේ වැඩසටහනක් මඟින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව එක් එක් සේවකයාගේ කාර්ය සාධනය හඳුනා ගැනෙයි.
- ආර්ථික අපහසුතා නිසා ඇතිවිය හැකි ආතතිය අවම කිරීම සඳහා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයට තේ පැන්, ආහාර සහ ඇඳුම් පැළඳුම් සඳහා දීමනා ගෙවනු ලැබේ.
- සියලුම සේවකයින් සේවයට පැමිණීම දිරිගැන්වීමක් ලෙස ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවනු ලැබේ.

- සමාගම වෙනුවෙන් ව්‍යාපාර මෙහෙයුම් සිදු කිරීමේදී සුදුසුකම් ලත් සේවකයින්ට ජංගම දුරකථන ලබා දෙන අතර ජංගම සහ ස්ථාවර / නේවාසික දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- කාර්යය සඳහා සරල ආර්ථික චේතනයකින් ඔබ්බට යමින්, දේශීය හෝ ජාත්‍යන්තර ක්ෂේත්‍රවල අධ්‍යාපනික, සංස්කෘතික හෝ ක්‍රීඩා ක්‍රියාකාරකම්වල දස්කම් දක්වන අපගේ කාර්ය මණ්ඩලයේ දරුවන්ට මූල්‍ය ආධාර පිරිනමනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ

- විකුණුම් ඉලක්ක සපුරා ගන්නා ප්‍රාදේශීය කළමනාකරුවන්ට ඉන්ධන හා නිල වාහන ලබා දේ.
- රැකියාවේ පීඩනය අවම කිරීම සහ ඵලදායිතාව වැඩි කිරීම සඳහා දිස්ත්‍රික් අලෙවි විධායක නිලධාරීන්ට යතුරුපැදි පිරිනමනු ලැබේ.
- සියලුම සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට සෞඛ්‍ය රක්ෂණ සේවාවන් සඳහා ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කර ඇත.
- ඉහළ අලෙවි ඉලක්ක වාර්තා කරන දිස්ත්‍රික් අලෙවි විධායක නිලධාරීන් දිරිගැන්වීම සඳහා දේශීය හෝ විදේශීය සංචාර පිරිනමනු ලැබේ.
- විවෘත සන්නිවේදන ප්‍රතිපත්ති මගින් පහළ සිට ඉහළට තොරතුරු නිදහසේ සහ අවංකව ගලායාම දිරිමත් කරන සැක බිය තොර පරිසරයක් දිරිමත් කෙරෙන ආයතනික සංස්කෘතියක් ස්ථාපිත කර ඇත.
- අධ්‍යාත්මික සහ නිපුණතා ආශ්‍රිත පුහුණු වැඩසටහන් අපගේ කාර්ය මණ්ඩලය වෙත නිතිපතා පිරිනමනු ලබන අතර මානසික සෞඛ්‍ය සහ වෘත්තීය කුසලතා සමස්ත වැඩිදියුණු කිරීම එහි අරමුණයි.

සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන්

- ඵලදායී අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුව
- MS Access භාවිතා කරමින් දත්ත කළමනාකරණය
- PHP සහ My SQL භාවිතයෙන් වෙබ් අඩවි සංවර්ධනය
- සේවා අලෙවිකරණය සඳහා වැඩමුළුව
- විධායක නිලධාරීන් සඳහා 'සුවිශේෂී නායකත්වය සඳහා ජීවත්වීමේ විද්‍යාව' ආයතනික පුහුණු වැඩමුළුව
- ආදායම් සහ බදු ගණනය කිරීම් 2018/2019 පිළිබඳ වැඩමුළුව
- සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ පුහුණුව - ආයතනික
- විගණන විමසුම් (විගණනය සඳහා පිළිතුරු දෙන්නේ කෙසේද? සහ කාර්ය සාධනය වැඩි දියුණු කරන්නේ කෙසේද?)
- පරිගණක දෘඩාංග සහ පරිගණක නඩත්තුව
- ගිවිසුම් නීතිය
- බදු ගණනය කිරීමේ පටිපාටිය
- SLFRS - 15 පාරිභෝගිකයන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම පිළිබඳ වැඩමුළුව
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය
- ICT ඩිප්ලෝමාව
- බදු පිළිබඳ දැනුවත් කිරීම
- ඩීසල් ජෙනරේටර් නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව
- කාර්යාල සහායකයන්ගේ යුතුකම් සහ වගකීම්
- ප්‍රවාහන කළමනාකරණය
- පුද්ගලික ලිපිගොනු හැසිරවීම සහ නඩත්තු කිරීම
- පිළිගැනීමේ කාර්යාල කාර්ය මණ්ඩලය (ඉදිරි ප්‍රවේශය) සඳහා දුරකථන කුසලතා සහ ආචාර විධි පුහුණුව
- පුහුණු සහ සංවර්ධනය තුළින් ආයතනික කාර්ය සාධනය පිළිබඳ සම්මන්ත්‍රණය
- කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව
- රසායනාගාර කළමනාකරණ පද්ධතියේ අභ්‍යන්තර විගණනය පිළිබඳ ISO/IEC 17025:2017 පුහුණුව

- වාර්ෂික තොග සත්‍යාපන පිළිබඳ වැඩමුළුව
- ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩමුළුව

වයස් කාණ්ඩයකට සේවක පිරිවැය (පුහුණු)		
වයස් කාණ්ඩයකට	**එකතුව**	**ආයෝජනය (රු.)**
20-30	13	127,882.90
31-40	51	175,629.70
41-50	97	279,520.15
51-60	35	91,287.30
එකතුව	**196**	**674,320.05**

ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක ආයෝජනය

- පිරිමි - රු: 454,082.10
- කාන්තා - රු: 220,237.95

අපගේ කාර්ය මණ්ඩල සංයුතිය

ලක් පොහොර සමාජිකයින්ගේ පූර්ණ කැපවීම ආයතනයේ සාර්ථකත්වයේ රහසයි. සමාගමේ ප්‍රධාන උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කරමින් ප්‍රධාන පරමාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කැපවී සිටින සේවකයින් 389 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් අප සතුව ඇත. රැකියා පදනම, සේවා කාණ්ඩය, ප්‍රදේශ සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව අපගේ රැකියා වර්ගීකරණය පහත දක්වා ඇත.

අනුමත සේවක සංඛ්‍යාව සහ පවතින සේවක සංඛ්‍යාව



2020.03.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව (ස්ථිර)



සේවකයින්ගේ පළාත්බද විසිරීම		
අනු අංකය	**පළාත**	**සේවක සංඛ්‍යාව**
1	උතුරු සහ උතුරු මැද පළාත	46
2	වයඹ පළාත	11
3	දකුණු පළාත	30
4	මධ්‍යම පළාත	32
5	නැගෙනහිර පළාත	18
6	ඌව පළාත	14
7	සබරගමුව පළාත	14
8	බස්නාහිර පළාත (ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ඇතුලත්ව)	223
	එකතුව	**388**

කාර්ය මණ්ඩලයේ සංයුතිය
(අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවය කරන කාර්ය මණ්ඩලය)

සේවා මට්ටම	**සේවා කාණ්ඩය**	**කේත අංකය**	**2020.03.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව**	**2020.03.31 දිනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව**	
				ස්ථිර	**ගිවිසුම් / කොන්ත්‍රාත්**
ජ්‍යෙෂ්ඨ	ජ්‍යෙෂ්ඨ කළමනාකාර	HM 2.1	1	0	
	ජ්‍යෙෂ්ඨ කළමනාකාර	HM 1.1	9	6	
	කළමනාකාර	MM 1.2	28	18	
තෘතීයික	කණිෂ්ඨ කළමනාකාර	JM 1.1	37	30	1
ද්විතීයික	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	MA 2.1	11	7	
	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	MA 1.1	165	156	
ප්‍රාථමික	ප්‍රාථමික ශිල්පීය	PL 3	58	75	
	ප්‍රාථමික අර්ධ ශිල්පීය	PL 2	6	4	
	ප්‍රාථමික ශිල්පීය නොවන	PL 1	99	92	
එකතුව			**414**	**388**	**1**

කාර්ය මණ්ඩල සංයුතිය (පළාත)



වයස අනුව



ස්ත්‍රී පුරුෂභාවය මත ස්ථිර සේවකයන්ගේ බෙදී යාම

අංකය	තනතුර	පුරුෂ	ස්ත්‍රී	එකතුව
1	ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	4	2	6
2	නියෝජ්‍ය / සහයක කළමනාකරුවන්	13	5	18
3	කණිෂ්ඨ කළමනාකරුවන්	24	6	30
4	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	4	3	7
5	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	83	73	156
6	ප්‍රාථමික ශිල්පීය	75	0	75
7	ප්‍රාථමික අර්ධ ශිල්පීය	4	0	4
8	ප්‍රාථමික ශිල්පීය නොවන	92	0	92
	එකතුව	**299**	**89**	

පවතින සේවක සංඛ්‍යාව - (වර්ගීකරණය අනුව)



වයස අනුව

වයස වර්ගීකරණය	එකතුව
20 - 30	38
31 - 40	85
41 - 50	150
51 - 60	115
	388

සේවක සෞඛ්‍යය හා ආරක්ෂාව

සමාගමේ අඛණ්ඩ කාර්ය සාධනය සඳහා සේවකයින්ගේ සෞඛ්‍යය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර අපගේ සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දීම නිසා සේවකයනගේ ඉහළ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවතී. කාර්ය මණ්ඩලය තුළ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පිළිබඳ සමස්ත විශ්වාසය වැඩි කර ඇත. මෙම උත්සාහය සේවා ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අතර කිසියම් කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ සෞඛ්‍යය, ආරක්ෂාව හෝ යහපැවැත්ම අවදානමට ලක් වූ ඕනෑම අහිතකර සිදුවීමක් හෝ සිදුවීමක් පිළිබඳ ක්ෂණික සමාලෝචනයක් සිදුකර එවැනි ගැටලුවක් නැවත ඇතිවීමේ හැකියාව තුරන් කිරීමට පියවර ගැනෙයි.

සුබසාධනය සහ මානව සම්පත්

අපගේ වටිනා කාර්ය මණ්ඩලය අතර කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, ස්වයං-වැඩිදියුණු කිරීම, නායකත්වය සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහාය වන, උපකාර වන සහ පහසුකම් සපයන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අපි හොඳින් වටහාගෙන සිටිමු. මේ සඳහා අපගේ කැපවීම අඛණ්ඩව පවතී. කළමනාකාරිත්වය මේ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් කටයුතු කරයි.

මීට අමතරව, අපගේ සමස්ත මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපි බොහෝ අංශවල අභ්‍යන්තර සහ බාහිර වෘත්තිකයන්ගේ සේවාවන්, තාක්ෂණික සහ නායකත්වය වර්ධනය කිරීමේ උපදේශන සහ දැනුම්වත් කිරීම් ලබාගනිමු. එහිදී අභිප්‍රේණය වැඩි කරන අතරම කුසලතා, අත්දැකීම් තුළින් ඉගෙනීම දිරිමත් කිරීම සහ උපදේශන ධාරිතාව වැඩිදියුණු කිරීම යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙයි.

සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුළුල් අවබෝධයක් එහි කාර්ය මණ්ඩලයට අත්‍යවශ්‍ය වේ. රසායනික පොහොර පිළිබඳ මනා පසුබිම් දැනුමක් ලබා ගන්නා අලෙවි අංශයේ සේවකයින් සඳහා ප්‍රධාන කාර්යාලයේ සහ පොළොන්නරුව ප්‍රාදේශීය ගබඩාවෙහි සංවිධානය කරන ලද විශේෂ පුහුණු වැඩසටහන් තුළින් මෙය සහතික කෙරේ.

දැනුම මිනිසා සම්පූර්ණ කරයි. පොත්පත් වියට පදනම වන අතර, වීබැවින් සමාගම හැකි උපරිම සහාය ලබාදෙයි. ඒ අනුව කාර්ය මණ්ඩලයට සහ සේවකයන්ට ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කරගැනීමට සහ වැඩිදියුණු කරගැනීමට පුස්තකාල පහසුකම් සපයා ඇත.

නවීන රසායනාගාරයේ පොහොර විශ්ලේෂණ ප්‍රමිතිකරණය කිරීමේදී රසායනාගාර කාර්ය මණ්ඩලයට වඩාත් කාර්යක්ෂම හා තාක්ෂණික වශයෙන් ස්ථාවර වීමට හැකිවන පරිදි විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

රඳවා තබා ගැනීම

කාර්ය මණ්ඩල සංවර්ධනය, සමානාත්මතාවය, මිත්‍රශීලීභාවය පවතින සහ පහසුකම් සහ ප්‍රතිලාභ ලැබෙන, ඉගෙනීමට හිතකර පරිසරයක් ඇති කිරීමට සමාගමට හැකි වී ඇත. එමගින් සැලසෙන රැකියා තෘප්තිය හේතුවෙන් මූල්‍ය වර්ෂය තුළ අඩු සේවක පිරිවැටුම සහ අවම සේවක සංඛ්‍යාවක් පවත්වා ගනිමින් ලබා ඇති ජයග්‍රහණය පිළිබඳව සමාගමට සතුටු විය හැකිය.

විගණන කමිටු වාර්තාව

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ,
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද
සේවා නීතිරීතිවලට අනුකූලව විගණන කමිටුව කටයුතු කර ඇත.

කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත් කර ඇත. එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වන අතර කමිටු සභාපති ලෙස භාණ්ඩාගාරයේ නියෝජිත කටයුතු කරනු ලැබේ. ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස කටයුතු කරති. මෙම කමිටුව 2019/2020 දී පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

- **එම්. ටී. අයි. වී. අමරසේකර මිය**
  කමිටු සභාපති
  (12-02-2019 සිට 03-12-2019)
- **ඊ. ජී. එච්. එම්. රණසිංහ මිය**
  කමිටු සභාපති
  (15-01-2020 මේ දක්වා)
- **එම්. පී. සරත් අබේරත්න මහතා**
  කමිටු සාමාජික
  (12-02-2019 සිට 03-12-2019)
- **එස්. එල්. ජී. බන්දුසිරි මහතා**
  කමිටු සාමාජික
  (12-02-2019 සිට 15-01-2021)
- **එල්.ජී. සමරවික්‍රම**
  කමිටු සාමාජික
  (13-01-2020 මේ දක්වා)

කමිටු රැස්වීම් සහ සහභාගීත්වය

මෙම මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුව විධිමත් ලෙස 03 වතාවක් රැස්වී ඇත. රැස්වීම්වලට සහභාගී වීම පහත පරිදි විය.

දිනය	2019.04.29	2019.07.12	2020.03.06
එම්. ටී. අයි. වී. අමරසේකර මිය	✓	✓	-
ඊ. ජී. එච්. එම්. රණසිංහ මිය	-	-	✓
එම්. පී. සරත් අබේරත්න මහතා	✓	×	-
එස්. එල්. ජී බන්දුසිරි මහතා	✓	✓	✓
එල්. ජී. සමරවික්‍රම	-	-	✓

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කර ඇති අතර කමිටුවේ ආරාධනයෙන් සාමාන්‍යාධිකාරීවරයා, අදාළ අංශ ප්‍රධානීන් සහ අනෙකුත් නිලධාරීන් පැහැදිලි කිරීම් ලබා දීම සඳහා රැස්වීම්වලට සහභාගී වේ.

කමිටුවේ කාර්යභාරයන්

1. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ සාධාරණත්වය විශ්ලේෂණය කිරීම.
2. සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ වටිනාකම, කාර්යක්ෂමතාව සහ සඵලතාවය සහතික කිරීම, සමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම.
3. සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීම.
4. බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම සහ විගණන කළමනාකරණ ලිපිය සමාලෝචනය කිරීම.
5. සමාගම් ක්‍රියාකාරකම් රීති, රෙගුලාසි සහ චක්‍රලේඛවලට අනුකූල ද යන්න සහතික කිරීම.
6. අභ්‍යන්තර විගණන විමසුම් සහ බාහිර විගණන විමසුම් සමාලෝචනය කිරීම.

7. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.

වර්ෂය තුළ ක්‍රියාකාරකම්

අදාළ පාර්ශ්ව වෙත සපයනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය සහ සත්‍යතාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබ ඇති මූල්‍ය වාර්තාකරණ පද්ධතිය කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර එහිදී ගිණුම්කරණ ප්‍රමිති සහ අදාළ පාර්ශ්ව ගනුදෙනු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් සිය නිරීක්ෂණ සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනය

සමාගමට හොඳින් සංවිධානය වූ අභ්‍යන්තර විගණන අංශයක් ඇති අතර එහි කාර්ය මණ්ඩලය විගණනය, මූල්‍ය ගණකාධිකරණය, බදු සහ ව්‍යාපාර පරිපාලනය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරන පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වේ.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණු:

1. ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම

2. මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම

3. මෙහෙයුම්වල වැය, කාර්යක්ෂමතාව සහ සඵලතාවය සමාලෝචනය කිරීම

4. කළමණාකරුවන්ට පැවරී ඇති මෙහෙයුම් සහ වැඩසටහන් පාලන සීමාව ඇතුළත පවතින බව සහතික කිරීම සහ මෙහෙයුම් සහ වැඩසටහන් සැලසුම් කර ඇති පරිදි සිදු කරන බවත්, නිසි තක්සේරුවකින් මෙහෙයුම් ප්‍රතිඵල ස්ථාපිත ඉලක්ක සහ ඉලක්කවලට අනුකූල බවත් තහවුරු කිරීම

5. නීති, රෙගුලාසි සහ අනෙකුත් අවශ්‍යතා කළමනාකරණ ප්‍රතිපත්තිවලට අනුකූල බව සහතික කිරීම

6. විශේෂ විමර්ශන පැවැත්වීම

අභ්‍යන්තර විගණන සැලැස්ම, ප්‍රාදේශීය පොහොර ගබඩාවල විගණන වැඩසටහන්, විගණන අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය සහ අවදානම් මත පදනම් වූ විගණන සැලසුම් කෙරෙහි අවධානය යොමු කරමින්, අදළ කාල සීමාව තුළ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය විගණන කමිටුව විසින් අධීක්ෂණය කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන වාර්තා සහ නිර්දේශ සලකා බැලීම සඳහා විගණන කමිටුව අභ්‍යන්තර විගණකවරයා සමඟ සාකච්ඡා කර ඇත. එසේම සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා අදළ කාර්තුවල වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වී ඇත.

ප්‍රාදේශීය පොහොර ගබඩා 47ක සහ ප්‍රධාන අංශ 09ක අභ්‍යන්තර විගණන වාර්තා හොඳින් සමාලෝචනය කරන ලද අතර, සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිවල සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය විය.

බාහිර විගණනය

ජාතික විගණන කාර්යාලය සමාගමේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කර ඇත.

කමිටුවට ලබා දුන් සහයෝගය

කමිටු සභාපතිවරුන් සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් විසින් කමිටුවට අපේක්ෂිත සහයෝගය ලබා දුන් අතර, වාර්තා කරන කාලය තුළ ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට කමිටුවට එය මහත් රුකුලක් විය.

කමිටුවේ තක්සේරුව

කමිටුවේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇති අතර, ක්‍රියාවලිය ඵලදායී වී ඇති බව නිගමනය කර ඇත.

ඊ. ජී. එච්. එම්. රණසිංහ මහත්මිය
සභාපති,
විගණන කමිටුව 22/07/2021



ප්‍රසම්පාදන අංශයේ වාර්තාව

මෙම අංශයේ මූලික රාජකාරිය වන්නේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා උපදේශන අත්පොතට අනුකූලව සමාගමේ අවශ්‍යතාවයට අනුව භාණ්ඩ, වැඩ සේවා සහ උපදේශන සේවා ලබා ගැනීමයි. කෘෂිකාර්මික ප්‍රජාවට නියමිත වේලාවට පොහොර අවශ්‍යතා සපුරාලීම සඳහා රටේ අවශ්‍යතාවට අනුව පොහොර ලබා ගැනීම අපගේ ප්‍රධාන අරමුණ වන අතර මෙම කාර්යය ක්‍රියාත්මක කිරීම සුදුසුකම් ලත් පළපුරුදු නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත ප්‍රසම්පාදන කණ්ඩායම වෙත පැවරේ.

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් රසායනික පොහොර ප්‍රමාණයන් ලබා ගැනීමට අපට හැකි විය.

පොහොර ආනයනය 2019/04/01 සිට 31/03/2020 දක්වා

වර්ගය	ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)
යූරියා 1	101,160.270
ට්‍රිපල් සුපර් පොස්පේට්	32,960.500
මියුරේට් ඔෆ් පොටෑෂ්	23,893.778
මුළු	**158,015.048**

ලක් පොහොර සමාගම මූල්‍යමය වශයෙන් ස්ථාවර රාජ්‍ය ව්‍යවසායයක් (SOE) වන බැවින් ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය සතු ඒකාබද්ධ අරමුදලෙන් කිසිදු මූල්‍ය සහයක් ලබා නොගනී. තවද, සමාගමේ ප්‍රසම්පාදන ක්‍රමය මඟින් රටේ වී සඳහා වන පොහොර සමස්ත අවශ්‍යතාවයෙන් 60%ක් සම්පූර්ණ කර ඇත. එබැවින්, නිෂ්පාදන ආදායම සහ ලාභදායිතාවය ඉහළ නැංවීමට සක්‍රීයව දායක වන අතරම, පොහොර නිෂ්පාදනය සහ අලෙවි කිරීම තුළින් පුළුල්, විවිධාංගීකරණය වූ වෙළඳපල හරහා ලක් පොහොර සමාගමෙහි ලාභය උපරිම කිරීම තහවුරු කෙරෙයි. එසේම ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා අංශය ඔස්සේ ලාභය ස්ථාවර කරගැනීම සඳහා සුවිසල් මෙහෙවරක් ප්‍රසම්පාදන අංශය ඉටු කරයි.

ඩොලමයිට්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සහ එප්පාවල රොක් පොස්පේට් වැනි දේශීය මිලදී ගැනීම්වලට අමතරව, සමාගම වික්සත් අරාබි එමීර් රාජ්‍යය, චීනය, ඉන්දුනීසියාව, බෙලාරුස් ජනරජය, ඊජිප්තුව, කටාර් සහ පාකිස්තානය වැනි රටවලින් පොහොර ආනයනය කරයි.

මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) සහ ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) වැනි ප්‍රධාන රසායනික පොහොර ආනයනය කිරීම ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (NPG) සහ පූර්ව සුදුසුකම්ලත් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය (Pre-

Qualified Registration) අත්පොතට අනුකූලව සිදුකරනු ලබයි. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත රසායනික පොහොර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කෙරේ.

මීට අමතරව, කීසරයිට්, සින්ක් සල්පේට්, ඩයිඇමෝනියම් පොස්පේට්, බොරේට්, ෂල්පේට් ඔෆ් ඇමෝනියා සහ කොමර්ෂල් එප්සම් සෝල්ට් වැනි වැනි සුළු අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර තරගකාරී ලංසු පට්පාටිය (ICBP) යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර එය ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත පදනම්ව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය යටතේ සිදු කරනු ලබයි. ඩොලමයිට්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) සහ එප්පාවෙල රොක් පොස්පේට් දේශීය මිලදී ගැනීම් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කමිටුවේ සහ අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව සිදුකෙරේ.





තොරතුරු සහ තාක්ෂණ අංශයේ වාර්තාව

ආයතනයේ ව්‍යාපාරික සහ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා ලංකා පොහොර සමාගමේ තොරතුරු හා තාක්ෂණ අංශය සුරක්ෂිත, විශ්වාසදායක සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සපයයි. ඊට අමතරව මෘදුකාංග, දෘඩාංග සහ ජාල ක්‍රියාකාරකම් ඵලදායි ලෙස සහ කාර්යක්ෂමව සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම තොරතුරු හා තාක්ෂණ අංශයේ වගකීමයි. ඉතා ප්‍රශස්ත දත්ත ආරක්ෂාවක් සහිතව කාලෝචිත කළමනාකරණ තොරතුරු ලබා දීම. සංවිධානයේ ප්‍රධාන තීරණ ගැනීමේදී උපකාරී වෙයි.

දිස්ත්‍රික් පොහොර ගබඩා සහ ප්‍රධාන කාර්යාලය අතර පවතින දැඩි සම්බන්ධතාවය හේතුවෙන් සමාගමේ පුළුල් ජාලය ඉතා තීරණාත්මක වී ඇති බැවින් දෝෂ රහිත සහ ප්‍රතිචාරාත්මක පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය යොදවා ඇත.

ලංකා පොහොර සමාගමේ ERP ක්‍රමයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ භාණ්ඩ තොග මිලදී ගැනීමේ සිට පාරිභෝගිකයා වෙත අවසාන විකුණුම දක්වා සැපයුම් දාම ක්‍රියාකාරකම් පිරික්සීම ඇතුළු සමාගමේ විවිධ කාර්යයන් සම්බන්ධ කිරීමට නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීමයි. ERP පද්ධතියේ ඒකාබද්ධ උපාය මාර්ගය මඟින් ක්‍රියාකාරී සහ ආයතනික සීමාවන් හරහා තොරතුරු හුවමාරු කර ගැනීම සහ සහයෝගීතාවය වැඩි දියුණු වී ඇත.

දැනට දිස්ත්‍රික් පොහොර ගබඩා 16ක් ප්‍රධාන කාර්යාලය (හුණුපිටිය) හා සම්බන්ධ වී ඇති අතර අවශ්‍ය දත්ත ERP ක්‍රමය භාවිතයෙන් සාර්ථකව ලබා ගනී. එපමණක් නොව, පරිගණකගත කර ජාල පහසුකම් සියලුම DFS වෙත සැපයීමේ ක්‍රියාවලිය මේ වන විට සිදුවෙමින් පවතී.



නීති අංශයේ වාර්තාව

බාහිර පාර්ශ්ව විසින් සීමාසහිත ලංකා පොහොර සමාගමට එරෙහිව පවරා ඇති නඩුවලට එරෙහිව සාර්ථකව ප්‍රතිචාර දැක්වීමටත් සමාගමේ ආයතනික කටයුතු සම්බන්ධයෙන් ඉහළම ප්‍රමිතියේ නෛතික පාලනයක් තහවුරු කිරීමටත් හැකි වී ඇති බව නීති අංශය ආඩම්බරයෙන් ප්‍රකාශ කරනු ලබයි. මෙම ප්‍රයත්නයන්හිදී, නීතිමය ගැටලු සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රවේශය රාජ්‍යයේ නීතිවලට අනුකූල බව නියත වශයෙන්ම තහවුරු කර ගැනීම සඳහා එම අංශය නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය නිරන්තරයෙන් ලබා ගනියි.

සමාගමේ ඉදිරි ප්‍රගතිය සඳහා සමාගමට අයවිය යුතු සම්පූර්ණ මුදලින් සැලකිය යුතු ප්‍රමාණයක් අයකර ගැනීම මෙන්ම ණය ආපසු නොගෙවූ අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සමාලෝචිත වර්ෂය තුළ නීති අංශයේ ප්‍රධාන මෙහෙවර විය.

මෙම අංශය අනෙකුත් අංශ වෙත සේවක ප්‍රශ්න සංවාද මාර්ගයෙන් විසඳා ගැනීමට පසුබිම සකසා දුන් අතර එමඟින් සේවා යෝජක- සේවක සමඟිය ප්‍රශස්ත ලෙස ම සහතික වීම නිසා කම්කරු ගැටළු අවම විය.

නීති අංශය, එහි විදිනෙද කටයුතුවල කොටසක් ලෙස, නීතිමය වලංගුභාවය තහවුරු වන ලෙස ගිවිසුම් සහ අදාළ වෙනත් ලිපි ලේඛන සකස් කරනු ලබයි.

කාර්මික අංශ වාර්තාව

ලක් පොහොර සමාගමෙහි කාර්මික අංශය සියලුම අංශවල ස්ථිර සේවකයන්ට ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නයන්හිදී තාක්ෂණික සේවාවන් ලබා දෙයි. ආයතනයෙහි හි සෑම සේවකයෙකුටම සුහදශීලී සහ සුවපහසු සේවා පරිසරයක් ඇති බව සහතික කිරීම සඳහා ප්‍රසම්පාදන ස්ථානයේ සිට බෙදා හැරීමේ ස්ථානය දක්වා එහි සේවාවන් සපයයි.

ආසන්න වශයෙන් පුද්ගලයන් විසි දෙනෙකුගෙන් සමන්විත මෙම අංශය තමන්ගේම ගුණාත්මක සේවාවන් රැසක් නිර්මාණය කර ඇති අතර ස්ථිර සේවකයින්, ලියාපදිංචි ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් සහ ඔවුන්ගේ නියෝජිතයින්, ලියාපදිංචි බෙදාහරින්නන් සහ සිල්ලර වෙළෙන්දන් සහ ආයතනය වෙත භාණ්ඩ හා සේවා සපයන්නන් සඳහා උසස් තත්ත්වයේ අපක්ෂපාතී තාක්ෂණික සේවාවන් සපයයි. ආයතනයෙහි සාර්ථකත්වයට සෑම විටම උරදෙන මෙම අංශය මෙම සමාගමේ සියලුම පාර්ශවකරුවන්, හවුල්කරුවන් සහ සේවකයින් සඳහා මිත්‍රශීලී සේවා පරිසරයක් නිර්මාණය කිරීමට පසුබිම සකස් කරයි.

සාප්පු හා කාර්යාල පනතෙන් නියම කර ඇති කාලයට වඩා අඩු කාලයක් සේවය කිරීමට වෙනත් අංශවලට යම් යම් සහන ලබාදී ඇතත්, එම සහනයෙන් ප්‍රයෝජන නොගෙන වැඩ කළ බව කාර්මික අංශයේ අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු. ශ්‍රී ලංකාවේ කම්කරු රෙගුලාසිවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන සම්පූර්ණ දිනයක්. කොට්ඨාශයේ කාර්ය මණ්ඩලයේ මෙම අසීමිත, පරාර්ථකාමී කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස, 2011 වසරේ සිට මේ දක්වා කිසිදු බාධාවකින් තොරව එහි ගුණාත්මක ඉලක්කයන් සෑම චිකක්ම සාක්ෂාත් කර ගැනීමට එය සමත් විය. අනෙකුත් අංශවලට යම් යම් සහන ලබාදී තිබියදීත්, ඔවුන්ට සේවය කිරීමට අවස්ථාව ලබා දුන්නේය.

අංශය මගින් සපයනු ලබන සේවාවන් පහත පරිදි වේ.

1. ආනයනික පොහොර මධ්‍යම ගබඩාවලට යැවීමට පෙර සහ බෙදාහැරීමේ අංශයෙන් දිවයින පුරා ප්‍රවාහනය කිරීමට පෙර කිරුම් පාලම් භාවිතයෙන් බර මැනීම

2. පොහොර ක්‍රමවත්ව ගබඩා කිරීම සහ නැවත ලබා ගැනීම සඳහා භාවිතා කරන සියලුම ස්ටැකර් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

3. මළු මහන මැෂින්, තරාදි, අත් කරත්ත, සීලර් යනාදී බෙදාහැරීමේ අංශය විසින් භාවිතා කරන සියලුම උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.

4. සියළුම ගොඩනැගිලි ඇතුළු භූමිය නඩත්තු කර පවත්වාගෙන යාම.

5. ජල සැපයුම, විදුලි සැපයුම සහ අභ්‍යන්තර දුරකථන පද්ධතිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කරවීම.

COVID-19 වසංගතය අතරතුර, කාර්යාල පරිශ්‍රය තුළ මෙන්ම පොහොර වෙළෙඳසල් තුළ සියලුම කාර්ය මණ්ඩලය ආරක්ෂිතව සහ ආරක්ෂිතව සේවය කිරීමට බාධාවකින් තොරව සහතික කිරීමට කාර්මික කණ්ඩායම ඔවුන්ගේ උපරිමය කළහ. ඔවුන්ගේ වැඩබිම් තුළ කොරෝනා රෝගීන් වාර්තා වීම අවම වීමට කණ්ඩායමේ සුපරීක්ෂාකාරීත්වය ප්‍රශංසනීය විය.



රසායනාගාර සේවා අංශයේ වාර්තාව

ලක් පොහොර රසායනාගාරය ISO/IEC 17025 (2017) සහතිකය ලබා ඇති අතර ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයෙන් ප්‍රතිතනය කර ඇති පොහොර සහ ඇසුරුම් ද්‍රව්‍ය පරීක්ෂණ පහසුකම්වලින් සමන්විත වේ.

මෙහිදී ප්‍රකාශිත සම්මත ක්‍රම, පාරිභෝගික අවශ්‍යතා සහ අදාළ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව රසායනාගාරය පරීක්ෂණ සේවා සිදු කරයි.

පොහොර පරීක්ෂණ රසායනාගාරයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය, පාරිභෝගිකයින්ට පරීක්ෂණ සහ විශ්ලේෂණ සඳහා විශිෂ්ට සේවාවන් සපයනු ලබන්නේ අදාළ සේවා පහසුකම්, නිෂ්පාදන පිළිබඳ තොරතුරු නියමිත වේලාවට ලබාදෙමින් සිය නිෂ්පාදන ලාභදායී සහ ඉහළම ගුණාත්මක තත්වයෙන් පවතින බව සහතික කිරීමට අඛණ්ඩව කටයුතු කිරීමෙනි.

රසායනාගාරයේ පරමාර්ථය වන්නේ සෑම සේවකයෙකුටම අවශ්‍යතා පිරිමැසෙන, සුදුසු මෙවලම්/උපකරණ සහ නිසි පුහුණුවක් ලබා දෙන පරිසරයක් නිර්මාණය කිරීමයි. සියලුම රසායනාගාර කාර්ය මණ්ඩලය ඔවුන්ගේ රාජකාරිවලට අදාළ ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි පිළිබඳව පුහුණු කර ඇති අතර ISO ප්‍රමිතීන්ට අනුකූල වේ.

ලක්පොහොර සමාගමේ රසායනාගාරය අපක්ෂපාතීව රසායනාගාර කටයුතු සිදු කරන අතර ඒවායේ අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීමට ව්‍යුහගත කර කළමනාකරණය කර ඇත. රසායනාගාර කළමනාකාරිත්වය විසින් රසායනාගාර ක්‍රියාකාරකම්/ පරීක්ෂණවල අපක්ෂපාතීත්වය සඳහා කැපවී සිටින අතර වගකීම සපුරා දරා සිටිනුයේ වාණිජ, මූල්‍ය හෝ වෙනත් කිසිදු පීඩනයකට ඔවුන්ගේ පරීක්ෂණවල අඛණ්ඩතාව අඩාල කිරීමට ඉඩ නොසැලසෙන අයුරිනි.

පොහොර සාම්පල සාරාංශ වාර්තාව පරීක්ෂා කිරීම අප්‍රේල් - මාර්තු (2019/2020)

පරාමිතිය	පරීක්ෂණ ගණන													
	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	ජනවාරි	පෙබරවාරි	මාර්තු	එකතුව	සමස්ත ආදායම
N	1	7	0	12	4	0	15	2	5	10	0	7	63	132,300.00
Ammo. N	1	2	0	0	0	0	0	0	0	4	0	0	7	14,700.00
P	0	15	1	11	3	1	14	0	3	8	0	6	62	136,400.00
K	4	8	0	11	2	4	12	0	4	11	0	6	62	136,400.00
Na	4	2	0	0	0	4	0	0	2	3	0	0	15	33,000.00
Ca	0	0	0	1	0	0	0	0	2	3	0	0	6	13,200.00
Mg	4	2	0	3	0	4	4	0	3	7	1	2	30	66,000.00
moisture	6	14	2	1	9	5	7	2	1	5	1	1	54	40,500.00
particle	6	14	1	2	3	5	7	2	2	6	1	3	52	31,200.00
HM	30	73	5	10	15	25	30	10	14	34	5	75	326	978,000.00
Water s. P	0	9	1	0	1	1	3	0	0	0	0	0	15	33,000.00
Citric P	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	-
Free acidity	1	2	0	0	0	0	0	0	0	3	0	0	6	6,600.00
Biuret	1	1	0	1	2	0	3	2	3	2	0	1	16	48,000.00
Free Phosphoric Acid	0	9	1	0	1	1	2	0	0	0	0	0	14	29,400.00
Sand content	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	-
pH	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	-
OC	0	0	0	0	0	0	0	0	0	0	0	6	6	19,200.00
s	1	2	0	0	0	0	0	0	0	3	0	0	6	9,000.00
වෙනත්	0	0	0	0	0	0	0	0	0	1	0	0	1	1,000.00
එකතුව	59	160	11	52	40	50	97	18	39	100	8	107		1,727,900.00

සාරාංශ වාර්තාව අප්‍රේල් - මාර්තු මාසය අනුව (2019-2020)



සාරාංශ වාර්තාව අප්‍රේල් - මාර්තු පරාමිති වශයෙන් (2019-2020)



ඇසුරුම් ද්‍රව්‍ය සහ කඩදාසි පරීක්ෂා කිරීම (2019/2020)

	පරාමිතිය	පරීක්ෂණ ගණන	ආදායම (රු.)
Packing Material	Dimension (Width, Length)	83	62,250.00
	Bulk Strength	4	12,600.00
	Width of the Tape	3	3,000.00
	Stitches per dm	3	2,250.00
	Linear Density	3	3,000.00
	Seam stitching	3	3,000.00
	Construction (Ends & Picks)	3	2,250.00
	Mouth of the Sack	83	41,500.00
	Fabric breaking Strength	3	6,000.00
	Bursting Strength	1	2,000.00
	Inner Liner (Width, Length, thickness)	6	7,500.00
Papers	No. of Samples (GSM)	111	111,000.00
	මුළු පිරිවය		**256,350.00**

රසායනාගාර ආදායම (2019 - 2020)

බාහිර සාම්පලවලින්	රු. 283,400.00



බෙදාහැරීම්
අංශ වාර්තාව

ආනයනය කරන ලද පොහොර හුණුපිටිය පරිශ්‍රයේ ගබඩා කර ප්‍රාදේශීය ගබඩා සහ බලයලත් අලෙවි නියෝජිතයන් හරහා කාර්යක්ෂමව බෙදා හැරීම බෙදාහැරීමේ අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

මීට අමතරව, පර්යේෂණ ආයතන විසින් නිකුත් කරන ලද නියෝග සහ ප්‍රමිතීන්ට අනුකූලව පොහොර මිශ්‍ර කිරීම මෙම අංශයේ තවත් රාජකාරියකි. ඒ අනුව දිවයින පුරා විසිර ඇති ගබඩා 45 ක් බෙදා හැරීමේ අංශය මගින් පාලනය වන අතර එම ගබඩාවල සම්පූර්ණ ධාරිතාව මෙට්‍රික් ටොන් 138,000 කි.

සමාලෝචිත වර්ෂයේදී මිශ්‍ර පොහොර මෙට්‍රික් ටොන් 4387.000ක් නිෂ්පාදනය කර රජයේ සහනාධාර වැඩසටහන යටතේ වී ගොවීන් සඳහා අවශ්‍ය මිශ්‍ර නොකළ පොහොරවල සම්පූර්ණ අවශ්‍යතාවයෙන් 60%ක් සපයන ලදී.



මීට අමතරව, 2019/20 වසර තුළ මිශ්‍ර පොහොර මෙට්‍රික් ටොන් 4387ක් ද නිෂ්පාදනය කර ඇත. මිශ්‍ර පොහොරවලින් වැඩි ප්‍රතිශතයක් (43.45%) නිෂ්පාදනය කරන ලද්දේ වෙනත් භෝග වගාවන් සඳහා ය. එයින් පොල් සඳහා පොහොර ප්‍රතිශතය 32.22%ක්, තේ සඳහා 20.93%ක් සහ රබර් සඳහා 3.4%ක් විය.

අලෙවි අංශ වාර්තාව

පහත සඳහන් අරමුණු අනුව ප්‍රශස්ත කාර්යක්ෂමතාවයක් සඳහා සමස්ත සැපයුම් දාමය කළමනාකරණය කිරීමේදී අලෙවිකරණ අංශයට ප්‍රධාන කාර්යයන් කිහිපයක් ඇත:

1. ලක් පෙහොර ආයතනයෙහි හි ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රය මෙය වන බැවින් සහ වත්මන් වෙළෙඳ පොළ තත්ත්වයන් අනුව ඉදිරි වසර තුනේදී අවධානය යොමු කෙරෙන ප්‍රධාන ක්ෂේත්‍රයක් වන බැවින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව තත්ත්ව සහතික පොහොර ලබා ගැනීම සහතික කිරීම මගින් රසායනික පොහොර අංශයේ වෙළඳපල නායකත්වය පවත්වා ගැනීම. SWOT හරහා හඳුනාගෙන ඇති බොහෝ ගැටලු සඳහා විසඳුම් සෙවීමට සැලසුම් කර ඇත.

පොහොර කාණ්ඩය	2021 යල මෙට්‍රික් ටොන්	2021 2022 මහ මෙට්‍රික් ටොන්	* 2022 යල මෙට්‍රික් ටොන්	*2022 2023 මහ මෙට්‍රික් ටොන්	*2023 යල මෙට්‍රික් ටොන්	*2023 2024 මහ මෙට්‍රික් ටොන්
UREA	59,028	92,325	58,968	92,232	60,060	93,940
TSP	7,589	11,870	7,582	11,858	7,722	12,078
MOP	17,708	27,697	17,690	27,670	18,018	28,182
එකතුව	**84,325**	**131,892**	**84,240**	**131,760**	**85,800**	**134,200**

2. රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව 2021 අවසානයේ දී 25% දක්වා වාර්ෂික වර්ධකයක් ලබා ගැනීම සහ 6% ක කෝටා ප්‍රතිපාදන සහිතව අනෙකුත් බෝග සඳහා අවශ්‍ය පොහොර වෙළඳපොළ සමඟ නැවත සම්බන්ධ වීම.

පොහොර කාණ්ඩය	2021 2022 මෙට්‍රික් ටොන්	2022 2023 මෙට්‍රික් ටොන්	2023 2024 මෙට්‍රික් ටොන්
නුමුහුන් පොහොර	54,000	75,000	86,250
මිශ්‍රිත පොහොර	18,000	25,000	28,750
සංයුක්ත පොහොර	-	50	100
එකතුව	**72,000**	**100,050**	**115,100**

3. කාබනික පොහොර අලෙවිය ක්‍රමානුකූලව වැඩි කිරීම

ලෝකය තිරසාරත්වය කරා වේගයෙන් ගමන් කරන විට, කෘෂිකර්මාන්තය ක්‍රියාකාරී ක්ෂේත්‍රවල විශේෂයෙන් සඳහන් කර ඇති බැවින් තිරසාර සංවර්ධන ඉලක්ක අංක 12 (වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය) සමාගමට තීරණාත්මක වේ. මීට අමතරව, කෘෂි රසායනවල විෂ සහිත ස්වභාවය සහ එය පසට හානි කරන ආකාරයත්, වාතය සහ ජල දහරා දූෂණය කිරීම සහ මානව සහ සත්ව සෞඛ්‍ය ගැටලුවලට දායක වන ආකාරය පිළිබඳවත් පුළුල් සංකථනයක් පවතී. එබැවින්, සමාගම සිය සමස්ත සමාජ වගකීමේ කොටසක් ලෙස මෙන්ම රාජ්‍ය ආයතනවලට අනුකූලව කාබනික ද්‍රව්‍ය කෙරෙහි යොමුවීමට සිදු වනු ඇත. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවට උසස් තත්ත්වයේ ඉහළ බලපෑමක් ඇති කාබනික පොහොර සහතික කිරීම සඳහා ලක් පොහොර සමාගම දේශීය වෙළඳපොළේ කාබනික පොහොර නිෂ්පාදකයින් සමඟ කටයුතු කරනු ඇත.

සමාලෝචිත වර්ෂය තුළ කාර්ය සාධනය						
මාසය	යූරියා	TSP	MOP	වී අලෙවිය (මෙට්‍රික් ටොන්)	වෙනත් භෝග සහනාධාර, සහනාධාර නොවන සහ මිශ්‍ර පොහොර අලෙවිය (මෙට්‍රික් ටොන්)	කාබනික පොහොර අලෙවිය (මෙට්‍රික් ටොන්)
අප්‍රේල්	6604.350	1470.700	706.550	8781.600	184.638	3.814
මැයි	25067.600	6453.300	6823.750	38344.650	181.714	24.552
ජූනි	11654.750	2870.250	4930.600	19455.600	245.985	9.553
ජූලි	1864.100	424.750	515.450	2804.300	218.508	10.887
අගෝස්තු	603.900	136.900	167.600	908.400	141.451	29.185
සැප්තැම්බර්	495.000	114.500	112.500	722.000	40.841	10.013
ඔක්තෝම්බර්	13989.950	4402.250	4510.400	22902.600	110.611	32.002
නොවැම්බර්	45278.300	8175.050	12623.550	66076.900	77.317	35.553
දෙසැම්බර්	16940.500	5725.050	4695.100	27360.650	262.090	18.667
ජනවාරි	1456.600	372.450	463.750	2292.800	475.088	26.917
පෙබරවාරි	395.300	86.900	109.900	592.100	128.426	18.062
මාර්තු	965.850	260.200	304.550	1530.600	322.503	9.350
සමස්ත	**125316.200**	**30492.300**	**35963.700**	**191772.200**	**2389.172**	**228.555**

පොහොර වර්ගය	විකුණුම් (මෙට්‍රික් ටොන්)	%
සෘජු	1638.345	63
පොල්	168.323	6
තේ	292.620	11
රබර්	31.225	1
එළවළු	16.342	1
පළතුරු	6.196	0.2
මල්	3.030	0.1
අපනයනය	37.276	1
වෙනත් ආහාර බෝග	196.025	7
කාබනික	228.355	9
එකතුව	**2617.737**	**100**



මූල්‍ය ප්‍රකාශන

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සීමාසහිත ලංකා පොහොර සමාගම





අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශ

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ අංක 150(1) සහ 151 වගන්තීන්ට අනුව එහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම සමාගමේ කටයුතු සහ සමාගමේ ලාභ අලාභ හිණුමෙහි සත්‍ය හා සාධාරණත්වය පිලිබිඹු වන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය.

මූල්‍යමය තත්වය සාධරණ නිර්වද්‍යතාවයකින් තීරණය කිරීමට ඉවහල් වන පරිදි විධිමත් ලේඛණ පවත්වාගෙන යන බවට, මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට සහ එම ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන නිමාකාරයෙන් සිදුවන බවට අංක 148 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු වගකව යුතු වේ. ඉදිරිපත් කරනු ලබව මූල්‍ය ප්‍රකාශන වල අවංකභවය හා වාස්තවිකතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගණුදෙනු වල ස්වරූපය හා අන්තර්ගතය නිසි අයුරින් පිළිබිඹු වන සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්ට වලඹෙමින් උචිත ගිණුම් ප්‍රතිපත්ති සංගතභාවයකින් යුතුව තෝරාගෙන භාවිතා කළ බවට අධ්‍යක්ෂවරු සහතික කරති

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලද බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය සහතිකකරයි.

තවද මෙම මූල්‍ය ප්‍රකාශන සමාගම් පනත යටතේ අවශ්‍ය තොරතුරු සම්පාදනය කරන අතර අධ්‍යක්ෂවරුන් තමන් සතු සමාගවම් පිළිබඳ දැනීම ප්‍රධාන මෙහෙයුම් හා සමාග මේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ නිහ්චය තොරතුරු මත පදනම්ව තම මතය ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන වීම පදනම මත පිළියෙල කර ඇත.

සමූහයේ වත්කම් සුරකීම්ලිබඳ අධ්‍යක්ෂවරුන් සාධාරණ පියවර ගෙන තිබෙන අතර වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලකවා ගැනීමේ අරමුණින් ඒ සම්බන්ධයෙන් උචිත අභ්‍යන්තර පාලව පද්ධති ස්ථාපිත කර තිබේ. සමාගම් පනතේ අංක 57 වගන්තිය යටතේ එවැනි බෙදාහැරීමකින් පසු සමාගමට නුඹුන්වත්භාවය පිළිබඳ පරීක්ෂාවෙන් සාර්ථකත්වය ලැබිය හැකි බවට ලැබී ඇති තොරතුරු මත සෑහීමට පත්වී, සමාගම් පනතේ අංක 56 (2) වගන්තිව අනුකූලව දැනට යෝජිත ලාභාංශ බෙදාහැරීමට අධ්‍යක්ෂ මිඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර යෝජිත ලංභාංශ සම්බන්ධයෙන් නුඹුන්වත්භාවය පිළිබඳ ප්‍රකාශනයක් සමාගමේ විගණකවරුන්ගෙන් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණුඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ විධිවිදාන යටතේ ශ්‍රී ලංකා පොහොර සමාගමේ විගණනය කිරීමේ බලය හිමි විගණකාධිපති මට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ඔවුන්ගේ මතය පිහිටුවීමට සුදුසු යැයි ඔවුන් සැලකූ පරීක්ෂාවන් භාරග ැනීම සඳහා අවශ්‍ය සෑම අවස්තාවක්ම සලසනු ලැබේ.

අනුකූලතා වාර්තාව

සමාගමේ සේවකයන් හා රජයට අදාළව සමාගමෙන් එහි පරිපාලිග සමාගම් වලින් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනය වන විට ගෙවීමට නියමිත සියළුම නීති ප්‍රකාර ගෙවම් සිය උපරිම දැනුම අනුව ගෙවා නිමකර ඇති බව හෝ අදාල පරිදි ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ

ජනත් විදානගේ
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි
සී/ස ලංකා පොහොර සමාගමේ
2021 ජූලි 22 දිනදී

සභාපතිවරයාගේ හා මූල්‍ය කළමනාකරුගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2020 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කරනු ලබනුයේ පහත දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වෙමිනි.

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- මහාභාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති සංයුක්ත පාලනය සම්බන්ධයෙන් හොඳම පරිචයන සංග්‍රහය

මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ විස්තර කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන සකස කිරීමේදී ප්‍රායෝගික කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත පරිදි හා නිරන්තරයෙන් යෝදාගත් බව අපි සනාථ කරමු.

කිසිම අපගමනයකින් තොරව නිර්දිශ්ට ගිණුම් ප්‍රමිතීන් යොදාගෙන තිබේ. ඉහළ මට්ටමේ විචාර බුද්ධි ගෝචර හා සංකීර්ණ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් විගණන කමිටියේ සහ අපගේ බාහිර විගණකයින්ගේ අදහස් විමසන ලදී.

වත්කම් සුරකීමේ, වංචා හා වෙනත් අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමේ හා අනාවරණය කර ගැනීමේ අරමුණෙන් අභ්‍යන්තර පාලන පද්ධති හා ගිණුම් ලේඛණ ස්ථාපිත කිරීමටද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා ඉදිරියටද ක්‍රියාත්මක වන පදනමක් මත සමාලෝචනයට, ඇගයීමට හා යාවත්කරණයට ලක්වී තිබේ. සමාගමේ අභ්‍යන්තර විගණකයින් විසින් කලින්කලට කරන ලද නිගමන තුළින් සමාගමේ ස්ථාලිත ප්‍රතිලත්ති හා පටිපාටි නිරන්තරයෙන්ම අනුගනය වී තිබෙන බවට සාධාරණ සහතික වීමක් සැලසී ඇත. එසෙ වුවද ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් තැබීමේ පද්ධතියක් තුළින් සැකසෙන සහතික වීම් කිරා බැලීමේ දී හදුනාගත යුතු වූ ආවේනික සීමාවන් තිබේ.

විගණන වල සඵලතාවය සමාලෝචනය කිරීමටත් විගණනය කිරීම, අභයන්තර පාලනය හා මූල්‍ය වාර්තාකරණයේ ගැටළු ගැන සාකච්ඡා කිරීමටත් සමාගමේ විගණන කමිටිය කලින් කලට අභ්‍යන්තර විගණකයින්ට හා බාහිර විගණකයින්ට පූර්ණ හා නිදහස් අවසරය දී තිබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසින් මූල්‍ය වාර්තා විගණනය කරන ලදී.

ජනත් විදානගේ
සභාපති

එන්. පී. සී. ඒකනායක
මූල්‍ය කළමනාකරු
22.07.2021

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒජිඑල්/සි/සිඑස්සි/2021/01 මගෙ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ඔක්තෝබර් 12 දින

සභාපති

සී/ස ලංකා පොහොර සමාගම

සීමා සහිත ලංකා පොහොර සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත ලංකා පොහොර සමාගමේ ("සමාගම") 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාගම විසින් සෘජුව මිලදී ගන්නා පොහොර වර්ග සමාගම තුළදී අලෙවි කිරීම, මිශ්‍ර කිරීම, කුඩා පැකට් ලෙස සැකසීම, නැවත මළු කිරීම, එක් එක් වර්ගයන් අතර මාරු කිරීම ආදී විවිධ ක්‍රියාවලියන්ට භාජනය වේ. ගිණුම් වර්ෂය තුළ මිලදීගත් සෘජු පොහොර සම්බන්ධයෙන් උක්ත විවිධ ක්‍රියාවලීන්ට ලක් කළ බවට සංඛ්‍යා ඇතුළත් කර අවසන් තොගය ගණනය කර ඇතත්, තොග ගණනයේදී හඳුනාගෙන ඇති පොහොර මෙට්ට්‍රික් ටොන් 101.17 ක තොග ඌනතාවයක් විකුණුම් පිරිවැයට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වසරේ ලාභය ආසන්න වශයෙන් රු. 5,085,500 කින් අඩුවනේ දක්වා තිබුණි.

(ආ) සමාගමේ ප්‍රයෝජනය පිණිස මිලදී ගන්නා සියලුම ද්‍රව්‍ය පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමකට ගිණුම් ගතකොට ගබඩාවට භාර දෙන අතර ගබඩාවෙන් අදාළ අංශය වෙත නිකුත් කරනු ලබන අවස්ථාවේදී අදාළ ද්‍රව්‍යයන් වත්කම් හෝ වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමේ ක්‍රමය භාවිතා කරනු ලබයි. ගිණුම් වර්ෂය තුළ පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ රු.1,978,401 ක ඌනතාවයක් ඇති වී ඇති අතර ඌනතාවය පිළිබඳ විමර්ශනයන් සිදුකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීම වෙනුවට ඌනතාවයේ අගය වත්කම් හා වියදම් ගිණුම් වලට ගලපා තිබුණි.

(ඇ) ලක් පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති වත්තල හුණුපිටිය ඉඩම සමාගම වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමකින් තොරව රු.1,868,965,707 ක අගයකට ප්‍රත්‍යාගණනයකොට ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පවරා ගන්නා ලද කැලණිය ප්‍රාදේශීය ලේකම් යටතේ පවතින පර්චස් 28 ක රජයේ ඉඩම සම්බන්ධයෙන් සමාගම වෙත නීත්‍යානුකූල අයිතියක් නොමැති වුවද ඉඩම් කොටස සඳහා රු.12,600,000 ක ලැබිය යුතු වන්දි මුදලක් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාගමේ පොහොර සැපයුම්කරුවන් සඳහා නියමිත පරිදි ගෙවීමට මහා භාණ්ඩාගරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් බැංකුව මගින් ලබාගත් කෙටිකාලීන ණය මුදලක් මගින් ගෙවීම් නිරවුල් කර තිබුණි. පසුව කෙටිකාලීන ණය මුදල මහා භාණ්ඩාගාරයේ වගකීමට යටත් දීර්ඝකාලීන ණයකට පරිවර්තනය කොට තිබූ නමුත් කෙටිකාලීන ණය සඳහා ගෙවන ලද ණය පොලී අයකර ගැනීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමග එකඟතාවයට පත් නොවීම හා කෙටිකාලීන පොලිය දීර්ඝකාලීන ණය මුදලට ඇතුළත් කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාරයේ වගකීම තහවුරු නොකළ රු.268,732,450 ක කෙටිකාලීන ණය පොලී මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) පොහොර ආනයනයේදී දෙපාර්ශවය එකඟ වූ ප්‍රමාණයන්ට වඩා අඩු ප්‍රමාණයක් සැපයුම්කරුවන් විසින් ලබාදී ඇති අවස්ථාවකදී සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකමින් අදාළ අඩු පොහොර තොගයේ වටිනාකම අඩුකොට ගිණුම් තැබිය යුතු වුවත් සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකම මිලදී ගැණුම් ලෙසත් අඩුවෙන් එවා ඇති තොගයේ වටිනාකම ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. වර්ෂය තුළ ඉන්වොයිස් කළ තොග වටිනාකමට වඩා අඩුවෙන් තොග ලැබීම්වල ලෙස රු.16,861,511ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර ඇති අතර වර්ෂාවසානයේ නොපියවූ ලැබිය යුතු ශේෂය රු.6,398,762 ක් විය. උක්ත ලැබිය යුතු ශේෂය අදාළ සැපයුම්කරුට ගෙවිය යුතු ශේෂයට ගලපා නිරවුල් කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් කෙටිකාලීන බැංකු ණය ලබාගැනීම මගින් උක්ත ශේෂයද සැපයුම්කරු වෙත ගෙවීම් කර නැවත සැපයුම්කරුගෙන් අයකර ගැනීමට සිදු වීමෙන් අතිරේක පොලී වියදමක් දැරීමට සිදු වී ඇති අතර ව්‍යාජ ලැබිය යුතු ශේෂයක් ගිණුම්වල නිරූපණය කර තිබුණි.

(උ) මුදල් පොතෙහි සටහන් කරන එක් එක් ගනුදෙනුව අදාළ දිනයේදී ලෙජරයට පිටපත් කිරීම වෙනුවට මාසයක ගනුදෙනුවල එකතුව ලෙජරයෙහි ගිණුම්ගත කිරීම හා ගනුදෙනු රාශියක එකතුවක් සඳහා ජ'නල් වවුචර් සකස් කොට තිබීම හේතුවෙන් ගනුදෙනු දෛනිකව සැසඳීමට නොහැකි වී තිබුණි.

(ඌ) පිළිවෙලින් රු. 72,102,543 ක්වූ වෙළඳ ණයගැතියන්, රු.4,636,187,820 ක්වූ වෙළඳ ණයහිමියන් හා රු. 59,421,950 ක්වූ විවිධ ණය හිමියන්ට අදාල ශේෂ සනාථ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධිවිධානවලට යොමුව	විස්තරය
(අ)	2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3.3 ඡේදය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර ගන්නා ලද දිරි දීමනා ක්‍රමයකින් හා ජාතික වැටුප් හා දීමනා ප්‍රතිපත්තීන්ට අනුව විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු.49,940,295 ක් දිරි දීමනා ලෙස සේවකයන් වෙත ගෙවීම් කර තිබුණි.
(ආ)	2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 06 පරිච්ඡේදය 5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය වර්ෂය අවසන් වී දින 210 ක් ගත වීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක PED/1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක	ප්‍රවාහන පහසුකම් හිමිකම නොමැති කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) වෙත වාහන ලබාදීමකින් තොරව ඉන්ධන ලීටර් 120

PED/1/2015 (i) දරන ව්‍යාපාර වක්‍රලේඛයෙහි වගන්තිය	රාජ්‍ය 3	ක් සඳහා රු.11,400 ක ඉන්ධන දීමනාවක් ලබාදී තිබූ අතර උක්ත වක්‍රලේඛය තුළින් ආවරණය නොවන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 09 වෙත වක්‍රලේඛ විධිවිධාන අතික්‍රමණය කරමින් එක් නිලධාරියකු වෙත රු.10,000 බැගින් වන සේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රු.1,160,000 ඉන්ධන දීමනා ලබාදී තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) පොහොර සැපයුම්කරුවන් සමඟ ඇතිකර ගන්නා ගිවිසුම් ප්‍රකාරව ආනයනික පොහොර තොග සඳහා බහාලුම් අංගනය දක්වා අදාළ වන සියළුම පිරිවැය සැපයුම්කරු ඉදිරිපත් කර ඇති මිලට ඇතුළත් වීම හේතුවෙන් ලිපිගොනු ගාස්තු, බහාලුම් සේදුම් ගාස්තු, වැටබදු හා මුද්දර ගාස්තු සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා විසින් දැරිය යුතු වේ. එහෙත් සැපයුම්කරුගේ වගකීමක් වන උක්ත කාර්යයන් නාවික නියෝජිත ආයතනයක් වෙත පැවරීම හේතුවෙන් පසුගිය වර්ෂ 2 ක කාලය තුළ එකතු වටිනාකම රු.4,222,578 ක අදාළ නොවන වියදම් සඳහා ගෙවීම් කර තිබුණි.

  (ආ) 2020/2021 මහ කන්නය තුළ වී සඳහා බෙදාදීම් සඳහා සහනාධාර පොහොර ප්‍රමාණවත් නොවීම නිසා එම අඩුපාඩුව මහහරවා ගැනීම සඳහා වෙනත් බෝග සඳහා පොහොර සපයන සැපයුම්කරුගෙන් ණය පදනම් මත යූරියා මෙට්‍රික් ටොන් 3,500 ක් ලබාගෙන තිබුණි. උක්ත පොහොර තොගය ලක් පොහොර සමාගම නමින් හා රජයෙන් නොමිලේ ලබාදෙන සහනාධාර පොහොර ලෙස නම් කිරීමකින් තොරව සමාගමේ ඇසුරුම් සහිතව ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී තිබීම හේතුවෙන් රජයේ සහනාධාර පොහොර අවභාවිතා කිරීම සඳහා අවස්ථාව සැලසී තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට හා විදේශීය සැපයුම්කාර සමාගමක් හා ලක් පොහොර සමාගම අතර දියර පොහොර සැපයීම වෙනුවෙන් ඇතිකරගත් ගිවිසුමට අනුකූල නොවන සේ විදේශීය සැපයුම්කාර සමාගම වෙත බැංකු අයිරාවක් ලබාගැනීම පිණිස 2018 වර්ෂයේදී ලක් පොහොර සමාගම සතු රු.94,438,766 ක් වටිනා ස්ථාවර තැන්පතු 02 ක් බැංකු ඇපකර ලෙස භාවිතා කිරීමට සමාගමේ කළමනාකාරිත්වය අවස්ථාව සලසාදී තිබුණි. මෙම ඇපකරය භාවිතයෙන් විදේශීය සැපයුම්කාර සමාගම 2019 පෙබරවාරි 12 දින වන විට රු.75,980,000 ක බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර එදිනට උපචිත වූ පොලිය සමග ගෙවිය යුතු මුළු මුදල රු.80,502,290 ක් වී තිබුණි. විදේශීය සැපයුම්කාර සමාගමඋක්ත බැංකු අයිරාව පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාගම ඇපකර ලෙස තබා තිබූ ස්ථාවර තැන්පතු දෙකෙන් හිඟ ණය ශේෂ පියවාගැනීමට බැංකුව කටයුතුකර තිබුණි. මෙම අවධිමත් අනීතික ගනුදෙනුව හේතුවෙන් මිලියන 17 ක අහිමි වූ පොලී ආදායමක් සමග ලක් පොහොර සමාගම වෙත ජනනය වී ඇති අලාභය රු.මිලියන 97.5 ක් වී තිබුණි.

(ඈ) ලක් පොහොර සමාගම හා විදේශීය සැපයුම්කාර සමාගමක් අතර 2017 අප්‍රේල් 17 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සපයන ලද දියර පොහොරවලින් 2021 මාර්තු වන විටත් රු.79,716,652 ක් වටිනා කල්ඉකුත් වූ පොහොර ලීටර් 109,408 ක ප්‍රමාණයක් භුණුපිටිය ප්‍රධාන ගබඩාවේ ගබඩාකර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) සමාගම පිරිවැය අඩු බෙදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමකින් තොරව හා ගබඩා අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ගබඩා 46 ක් පවත්වා ගෙන යාමට හා ඒ තුළින් වැටුප්, පරිපාලන, මෙහෙයුම් හා ප්‍රවාහන වියදම් අත්‍යාවශ්‍ය නොවන ලෙස ඉහළ නංවා ගැනීම හේතුවෙන් ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන පොහොර බෙදාහැරීම තුළින් අඛණ්ඩව මෙහෙයුම් අලාභ ලබා තිබුණි.

(ඊ) සහනාධාර පොහොර තොග නිසි කළමනාරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු නොකිරීම හේතුවෙන් පසුගිය ගිණුම් වර්ෂය තුළ රු.40,288,200 ක් පමණ වටිනා පොහොර මෙ.ටො 671.47 ක් හා ගිණුම් වර්ෂය තුළ රු.13,526,400 ක් වටිනා සහනාධාර පොහොර මෙ.ටො 225.44 ක් ගොවීන් වෙත බෙදාහැරීමට නොහැකි ලෙස හානියට පත්වීම හේතුවෙන් රජයට සිදු වී ඇති මුළු අලාභය රු.53,814,600 ක් විය.

(උ) වසරේ ලාභය හා නැව් නිෂ්කාශන ආදායම පදනම් කර ගනිමින් 2020 මාර්තු මස මූලික වැටුප හා ජීවන වියදම් දීමනා මත මාස 03 ක දිරි දීමනාවක් ගෙවීම සඳහා පිළිවෙලින් 2020 මාර්තු මස 20 දින හා 2020 සැප්තැම්බර් 25 දිනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා

02 ක් ඉදිරිපත් කර තිබුණි. අවස්ථා දෙකෙහිදීම නැව් නිෂ්කාශන ආදායමින් 60% ක් නොඉක්මවන පරිදි වාර්ෂික දිරිදීමනා ගෙවීම් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී ඇතත් ඊට අනුකූල නොවන සේ නැව් නිශ්කාශන ආදායම සැලකිල්ලට ගැනීමකින් තොරව 2020 මාර්තු මස ගෙවා තිබූ මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පදනම් කර ගනිමින් මාස 03 ක වැටුපක් දිරිදීමනා ලෙස ගෙවීම් කර තිබුණි. අධ්‍යක්ෂමණ්ඩල තීරණය අනුව ගෙවීම් සඳහා අනුමත කර තිබූ උපරිම දිරි දීමනා ප්‍රමාණය (නැව් නිෂ්කාශන ගාස්තුව*60%= රු.44,407,138*60%) රු.26,644,282 කි. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූල නොවන සේ එකතුව විටිනාකම රු.49,940,295 ක දිරි දීමනා ගෙවීම් කිරීම හේතුවෙන් රු.23,296,013 ක මුදලක් අනුමැතියකින් තොරව දිරි දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ඌ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සමාගමේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් ලකුණු ලබාදීමේ ක්‍රමය වෙනස් කරමින් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන දක්ෂතා සඳහා අනුමත ලකුණු ප්‍රමාණය ලකුණු 25 සිට ලකුණු 60 ක් දක්වා වැඩි කරමින් තනතුරු සඳහා ඉතා වැදගත් වන ක්ෂේත්‍රයේ පලපුරුද්ද සඳහා වෙන් කර තිබූ ලකුණු 30, ලකුණු 05 දක්වා අඩු කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබ සිටි කුසලතා හා පලපුරුද්ද සහිත අයදුම්කරුවන්ට දැඩි අසාධාරණයක් ඇති වන සේ අඩු කුසලතා හා අඩු පලපුරුද්ද සහිත අයදුම්කරුවන් වෙත පෞද්ගලික වන සේ 2019 වර්ෂයේදී කළමනාරණ සහකාර තනතුර සඳහා 28 දෙනෙකු බඳවා ගැනීමට සමාගමේ කළමණාකාරීත්වය කටයුතු කර තිබුණි.

(එ) ගබඩා සේවකයන් සඳහා රු.10,530 ක් හා කාර්යාලගත සේවකයන් සඳහා රු.7,938 ක් ලෙස එකතු වටිනාකම රු.4,813,131 ක් වාර්ෂික ඇඳුම් දීමනාව ලෙස ගෙවීම් කර තිබුණද මේ සඳහා පදනම් වූ නෛතික ප්‍රතිපාදන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) රජයේ ආයතන සඳහා නව වාහන මිලදී ගැනීම අයවැය වක්‍රලේඛ අංක 07/2019 න් සීමාකොට, පවතින වාහන අළුත්වැඩියාකොට භාවිතයට ගත යුතු බවට රාජ්‍ය ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඇති පසුබිමක වර්ෂ 10 කට වැඩි වාහන අපහරණය කර කල්බදු පදනම මත වාහන මිලදී ගැනීම සුදුසු බව 2021 ජනවාරි 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. අපහරණයට යෝජිත වාහන සම්බන්ධයෙන් පසුගිය වර්ෂ 03 ක කාලය තුළ අසාමාන්‍ය අලුත්වැඩියා වියදම් දරා නොතිබුණු අතර ඉදිරියේදී සිදු කළ යුතු සුවිශේෂී අලුත්වැඩියා තත්වයන් නිරීක්ෂණය නොවුණි. ධාවන සටහන් අනුව රාජකාරී බාධාවන්ගෙන් තොරව ධාවනය වී ඇති පාදක වූ තාත්වික විෂයයගත වාහන තාත්වික පැහැදිලි අවශ්‍යතාවයකින් තොරව අපහරණය කිරීමට කටයුතු කරන බව නිරීක්ෂණය විය.

(ඔ) ලේක්හවුස් ආයතනය මගින් සමාගමේ පොදු දැන්වීම් පලකරවා ගැනීමේ ක්‍රමය වෙනස් කරමින් සභාපතිවරයාගේ ඉල්ලීමකට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව පෞද්ගලික ප්‍රචාරණ ආයතනයක් මගින් පුවත්පත් දැන්වීම් පලකරවා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් පූර්වයෙන් ලේක්හවුස් ආයතනයෙන් දැන්වීම් පලකරවා ගැනීමට දරූ වියදම මෙන් දෙගුණයකට අධික වියදමක් දැරීමට සමාගමට සිදුවී තිබුණි .ගිණුම් වර්ෂය තුළ පොදු දැන්වීම් සඳහා උක්ත පෞද්ගලික ආයතනය වෙත ගෙවා ඇති මුදල රු.2,243,376 ක් විය.

(ඕ) සමාගමේ කළමනාකාරිත්වය ගිණුම් වර්ෂය තුළ කාරක ප්‍රාග්ධනය මැනවින් කළමනාකරණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රු.66,858,564 ක බැංකු අයිරාවක් වෙනුවෙන් රු.572,290 ක වළක්වාගත හැකිව තිබූ ණය පොලී වියදමක් දැරීමට සිදු වී තිබුණි.

(ක) සහනාධාර ක්‍රමය තුළ වී ගොවිතැන සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය අනුමත කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා අනුමත ප්‍රමාණයෙන් පොහොර ලබාදීම හැර පොහොර අලෙවි ප්‍රවර්ධනය තුළින් ආදායම් වැඩි කර ගැනීමට වර්තමාන පොහොර බෙදාහැරීමේ ක්‍රමය තුළ සමාගම වෙත අවකාශ නොතිබියදී ලක් පොහොර නමින් ලොකු, කුඩා කුඩ 1,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.470,000 ක අනාර්ථික වියදමක් සිදු කර තිබුණි. අලෙවි ප්‍රවර්ධනය සඳහා මුද්‍රණය කර ඇති මෙම කුඩ තොගයෙන් කොටසක් සමාගමේ සේවකයන් වෙත නොමිලේ බෙදාහැර ඇති අතර ඉතිරි කුඩ 455 ක් මාස 16 ක් තිස්සේ පාරිභෝගික ද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කර තිබුණි.

(ග) ගිණුම් වර්ෂය තුළ ආනයනය කරන ලද ණයවර ලිපි 04 කට අදාළ TSP මෙ.ටො 11,024.25 ක් (රසායනාගාර වාර්තා අසමත් වීම හේතුවෙන්) ගොවි ජනතාව වෙත නිකුත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අනුමැතිය ලැබී නොතිබුණි. කෙසේ නමුත් රසායනාගාර වාර්තා නිකුත් වීමට පෙර අනුමැතියකින් තොරව සමාගම විසින් උක්ත පොහොර තොග ගොවි ජනතාව වෙත බෙදා හැර තිබුණි. ලක්පොහොර සමාගම විසින් ගොවීන් වෙත බෙදාහරින ලද උක්ත ප්‍රමිතියෙන් තොර පොහොර තොග සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය නිර්දේශ කර නොතිබූ නමුත් පොහොර සඳහා ගෙවිය යුතු දිනට කෙටිකාලීන බැංකු ණයක් මගින් ගෙවීම් පියවා පසුව මහා භාණ්ඩාගාරයේ වගකීම් සහිතව දිගු කාලීන ණය මුදලකට පරිවර්තනය කොට විධිමත් අනුමැතියකින් තොරව සහනාධාර මුදල් ලබා ගැනීමට සමාගම කටයුතු කර තිබුණි.

(ච) ආනයනික පොහොර තොග සම්බන්ධයෙන් ලබාගත් රසායනාගාර පරීක්ෂණ වාර්තා අසමත් වීම හේතුවෙන් පොහොර, ආනයනික පොහොර සමාගම් 02 කට අදාළ එකතු

වටිනාකම ඇමරිකානු ඩොලර් 589,587.5 ක කාර්යසාධන බැඳුම්කර 03 ක් අයකර ගැනීමට සමාගම කටයුතු කර තිබූ අතර ඊට එරෙහිව සැපයුම්කරුවන් බේරුම්කරණයට යොමු වී තිබූ අතර බේරුම්කරණය හමුවේ අදාළ සමාගම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොමැති බව තහවුරු කර ප්‍රමිතින්ට අනනුකූල පොහොර සැපයීම මගින් සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණත් එසේ නොකර සමාගම විසින් සමතයකට පත්වී අයකර ගත් කාර්යසාධන ඇපකර ආපසු ගෙවා තිබුණි. මෙය මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඡ) සමාගම සතුව ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයේ (Sri Lanka Accreditation Board) හි ලියාපදිංචිය ලත් රු.19,130,944 ක වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 69 ක් වන අතර වර්ෂය තුළ උපයා තිබූ ආදායම රු.278,730 කි. මෙම රසායනාගාරයෙන් ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතරම මෙම නිසා රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිතව පැවතුණ බව නිරීක්ෂණ විය.

(ට) රසායනික පොහොර භාවිතය අඩු කොට කාබනික පොහොර භාවිතය ප්‍රවලිත කිරීම සඳහා නුවර, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි රසායන පොහොර ප්‍රතිපාදනය 25% කින් අඩුකර කාබනික හා මිශ්‍ර පොහොර ලබාදීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් උපදෙස් ලබා දී ඇතත් ඊට අනුරූපිව කාබනික පොහොර හා මිශ්‍ර පොහොර නිෂ්පාදනය හා බෙදාහැරීම සඳහා සමාගම විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ඩ) ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීම සඳහා 2017 වර්ෂයේ සිට ගිණුම් වර්ෂය දක්වා එකතු වටිනාකම රු.38,176,014 ක පිරිවැයක් දරා ඇති නමුත් උක්ත පද්ධතිය සමස්ත ආයතනයම හා සමස්ත ක්‍රියාවලියම ආවරණය වන පරිදි ස්ථාපිතකොට නොතිබීම හා ස්ථාපිතව ක්‍රියාත්මකවන පද්ධතින්ද ශක්තිමත් පාලනයන්ගෙන් තොරව ක්‍රියාත්මක වීම හේතුවෙන් දරන ලද ස්ථාපනය කිරීමේ පිරිවැයෙන් හා ආසන්න වශයෙන් රු.1,580,000 ක් වන ස්ථාපිත කරන ලද ආයතනය වෙත ගෙවන වාර්ෂික නඩත්තු පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.

(ණ) ගිණුම් අංක 2019/MOA/CRC/UR(G)/04/01 හා ගැණුම් ඇණවුම් අංක 814 යටතේ MV Alby Meloty නෞකාවෙන් යූරියා මෙ.ටො 14250 ක් ආනයනය කර තිබුණි. නෞකාවෙන් පොහොර තොග ගොඩබාන අතරතුර නෞකාව තුළ පොහොර ගල්ගැසී, දූර්වර්ණ වී තිබීම හේතුවෙන් සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා සමග

එකහතාවයෙන් කැළණිය පෙතියාගොඩ ප්‍රදේශයේ ගබඩාවක ගබඩාකොට දෙපාර්ශවයේ එකහතාවයෙන් පත්කරන ලද පරීක්ෂණ කමිටුවක නිර්දේශය මත හුණුපිටිය ලක් පොහොර සමාගමේ ගබඩා කර පසුව ගොවීන් වෙත බෙදාහැර තිබුණි. දෙපාර්ශවය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව අපේක්ෂිත තත්ත්වයේ පොහොර ලැබී නොමැති අවස්ථාවකදී පොහොර තොගය ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව තිබියදී එසේ සිදු කිරීම උක්ත ගනුදෙනුව සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය දැනුවත් නොකිරීම, ගල්ගැසී, දූර්වර්ණ වී තිබූ පොහොර තොග සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් රසායනාගාර පරීක්ෂාවක් සිදු කරවා නොගැනීම හා ඒකාබද්ධව සිදු කෙරුණු පරීක්ෂණය සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි නියෝජිතයෙකු ඇතුළත් කර නොගැනීම හේතුවෙන්, පොහොර තොගය සම්බන්ධයෙන් සිදු කළ යුතු අත්‍යාවශ්‍ය ක්‍රමවේදයන් නොසලකා සමාගමේ කළමනාකරණය ක්‍රියාකර ඇති බව නිරීක්ෂණය විය.

3. **වෙනත් කරුණු**

(අ) සහනාධාර පොහොර ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක වන දින සිට වී වගාව සඳහා පොහොර නිකුත් කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ලක් පොහොර සමාගම කටයුතු කරනු ලබන අතර එදින සිට අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි සම්බන්ධ වෙනත් කාර්යයන් විශාල ලෙස අඩුවී ඇත. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ උපදෙස් මත ප්‍රාදේශීය පොහොර ගබඩා මගින් පොහොර නිකුත් කිරීම සිදු කරනු ලබන අතර ක්ෂේත්‍රය තුළ අලෙවිකරණ කටයුතු හා නව අලෙවි ප්‍රවර්ධන උපක්‍රම හා වැඩසටහන් ක්‍රියාත්මකවීමක් හෝ අලෙවිකරණ සුපරීක්ෂණයක් ආදී කටයුතු බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ ඇතුළත් නොවේ. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම වෙනුවට සමාගම අනුමත අලෙවිකරණ කාර්යය මණ්ඩලයට අයත් දිස්ත්‍රික්ක අලෙවි ප්‍රවර්ධකයන්, ප්‍රාදේශීය අලෙවි ප්‍රවර්ධකයන්, අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් යන තනතුරවල දිගින් දිගටම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේදීද ප්‍රාදේශීය අලෙවි කළමනාකරු තනතුරු 3 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් සමාගමට වැටුප් හා දීමනා සඳහා නිෂ්කාර්යය පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව අනුමත ස්ථිර තනතුරු පුරප්පාඩු සඳහා සේවක බඳවාගැනීමකින් තොරව මාස 06 කට වරක් සේවයේ නැවත යෙදවීමේ පදනම යටතේ අනියම් සේවකයින් 12 දෙනෙකුගේ සේවය ලබාගෙන ඒ වෙනුවෙන් රු.1,362,691 ගෙවීම් කර තිබූ අතර සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සීමාවාසික පුහුණුවන්නන් 4 දෙනෙකු බඳවාගෙන සමාලෝචිතවර්ෂය තුළ රු.2,74,850 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඇ) අනුමත තනතුරු සඳහා අවශ්‍යවන පුහුණු අවශ්‍යතාවයන් හා අපේක්ෂිත ප්‍රතිඵල සම්බන්ධ ඇගයීමක් තුළින් පිළියෙළ කරන ලද වාර්ෂික පුහුණු සැලැස්මකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ වැඩ මුළු හා පුහුණු සැසි සඳහා නිලධාරීන් සහභාගී කරවීම සඳහා රු.1,671,730 ක පිරිවැයක් දරා තිබුණි.

(ඈ) පොහොර ලැබීම, නිකුත් කිරීම, හුවමාරු කිරීම ඇතුළු පොහොර සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණකගත කර තිබූ නමුත් පරිගණක පද්ධතිය වෙත පෙර දිනයක යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමේ හැකියාව පැවතීම, අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තොග පාලනය හා සම්බන්ධ පරිගණක පද්ධතිය පිළිබඳ විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ලාභ අලාභ හා විස්තීර්ණ අදායම් පිළිබඳ ප්‍රකාශය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

	සටහන්	2020	2019
අයභාරය	3	2,100,583,296	1,869,949,695
විකුණුම් පිරිවැය	4	(1,832,856,472)	(1,680,578,537)
දළ ලාභය		**267,726,824**	**189,371,158**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	5	209,623,485	107,856,870
පරිපාලන වියදම්	6	(550,184,970)	(536,274,315)
බෙදාහැරීම් වියදම්	7	(21,423,709)	(42,014,342)
මෙහෙයුම් ලාභය		**(94,258,371)**	**(281,060,628)**
මූල්‍ය ආදායම්	8	345,946,426	433,720,019
මූල්‍ය වියදම්	8	(63,244,126)	(32,877,346)
බදු පෙර ලාභය		**188,443,929**	**119,782,045**
ආදායම් බදු	9	(90,450,653)	(154,288,123)
වර්ෂය සඳහා ලාභය		**97,993,276**	**(34,506,078)**
වෙනත් විස්තීරණ ආදායම්			
අයුගණන ලාභ/අලාභ මත බැඳීම්		(10,206,319)	(6,132,395)
ප්‍රත්‍යාගණන අතිරිකතය මත විලම්භිත බදු ප්‍රතිලාභ		5,493,967	113,390,169
සමස්ත විස්තීරණ ආදායම		**(4,712,352)**	**107,257,774**
වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම		**93,280,924**	**72,751,696**
කොටසක මූලික ඉපයුම	10.1	1.95	(0.69)
ලාභාංශ ඉපයුම	10.2	0.59	(0.21)

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.

අංක 88 සිට 130 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයන් සැලකිය යුතුයි.

මූල්‍ය තත්ව ප්‍රකාශනය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

	සටහන්	2020	2019
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	11	2,705,686,663	2,744,935,187
නොනිමි වැඩ	12	676,729	676,729
අස්පෘශ්‍ය වත්කම්	13	13,754,126	17,501,026
මුළු ජංගම නොවන වත්කම්		**2,720,117,519**	**2,763,112,942**
ජංගම වත්කම්			
තොගය	14	225,993,757	646,533,328
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	15	18,802,655,103	19,388,003,091
සේවක ණය හා අත්තිකාරම්	16	40,730,642	37,891,499
කල්පිරීම් සඳහා පවත්වාගෙන යන ආයෝජන	17	698,334,484	634,370,554
අනෙකුත් මූල්‍ය වත්කම්	18	2,267,056,772	3,437,106,212
වත්මන් බදු වත්කම		41,815,680	23,998,980
මුදල් හා මුදල් සමාන දෑ	19	570,071,557	151,964,476
මුළු ජංගම වත්කම්		**22,646,657,994**	**24,319,868,140**
මුළු වත්කම්		**25,366,775,513**	**27,082,981,082**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	20	502,456,080	502,456,080
ප්‍රත්‍යාගණන සංචිත	21	2,297,282,725	2,291,788,758
රඳවාගත් ලාභය		3,341,503,885	2,736,939,175
මුළු හිමිකම		**6,141,242,690**	**5,531,184,013**
ජංගම නොවන වගකීම			
සේවක පාරිතොෂික බැඳීම්	22	68,393,216	59,861,488
විලම්බිත බදු	23	169,037,795	643,022,709
ගෙවිය යුතු ණය	25	-	5,650,658,426
මුළු ජංගම නොවන වගකීම්		**237,431,011**	**6,353,542,623**
ජංම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	24	4,694,602,515	5,685,527,349
ගෙවිය යුතු ණය	25	14,103,482,956	9,144,554,912
තැන්පතු හා අත්තිකාරම් ලැබීම්	26	44,458,457	148,972,883
උපචිත වියදම් හා වෙන්කිරීම්	28	78,699,320	108,446,379
බැංකු ඇයිරා	19	66,858,564	110,752,922
මුළු ජංගම වගකීම්		**18,988,101,812**	**15,198,254,446**
මුළු හිමිකම් හා වගකීම්		**25,366,775,513**	**27,082,981,082**
කොටසක ශුද්ධ වටිනාකම		**122.22**	**110.08**

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුරූපව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි.

මූල්‍ය කළමනාකරු

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වගකීමට බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් කළේ

සභාපති

අධ්‍යක්ෂ

14.07.2021
කොළඹ

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ
අංක 88 සිට 130 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයන් සැලකිය යුතුයි.

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත නැවත ප්‍රකාශිත	රඳවාගත් ලාභ	එකතුව
2018 අප්‍රේල් 01 දිනට ශේෂය (පෙර වාර්තා කර ඇත)	**502,456,080**	**2,028,858,589**	**2,792,590,448**	**5,323,905,117**
විලම්බිත බදු ප්‍රකාශය මත ගැලපීම්			506,307,200	506,307,200
2018 මාර්තු 31 දිනට ශේෂය	**502,456,080**	**2,028,858,589**	**3,298,897,648**	**5,323,905,117**
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	(12,800)	(12,800)
වර්ෂය සඳහා ලාභය	-		(34,506,078)	(34,506,078)
අනෙකුත් විස්තීරණ ආදායම් (සටහන් අංක 01)	-	262,930,169	(6,132,395)	256,797,774
ලාභාංශ වෙන්කිරීම්	-	-	(15,000,000)	(15,000,000)
2019 මාර්තු 31 දිනට ශේෂය	**502,456,080**	**2,291,788,758**	**3,243,246,375**	**6,037,491,213**
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	10,470,553	10,470,553
වර්ෂය සඳහා ලාභය	-	-	97,993,276	97,993,276
අනෙකුත් විස්තීරණ ආදායම් (සටහන් අංක 01)	-	5,493,967	(10,206,319)	(4,712,352)
2020 මාර්තු 31 දිනට ශේෂය	**502,456,080**	**2,297,282,725**	**3,341,503,885**	**6,141,242,690**

සටහන් අංක 01

ඉහත සඳහන් සටහන 1 ට අදාළව, මේ වසරේ නිවැරදි කරන ලද ඉඩම් සඳහා විලම්බිත බදු ගණනය කිරීම පසුගිය වසර සඳහා සලකා බලා නොමැත.

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ

අංක 88 සිට 130 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයන් සැලකිය යුතුයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල්වලිනි

		2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශ			
බදු පෙර ලාභය		188,443,929	119,782,045
ගැලපීම්			
ක්ෂයවීම්		52,382,408	51,673,740
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		4,457,400	4,375,244
දේපල, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/අලාභ		2,289,940	(2,741,263)
වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණය		19,804,991	36,503,462
වර්ෂය සඳහා සේවක පාරිතෝෂික අයකිරීම්		10,284,130	8,553,032
පොළී ආදායම		(345,946,426)	(433,720,019)
පොළී වියදම		63,244,126	32,877,346
පෙර වර්ෂයේ ගැලපීම්		10,470,553	(12,800)
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය		**5,431,051**	**(182,709,212)**
තොගය		400,734,580	1,583,458,863
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ		585,347,988	(210,087,483)
සේවක ණය හා අත්තිකාරම්		(2,839,143)	3,655,502
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ		(990,924,834)	3,177,059,150
තැන්පතු හා අත්තිකාරම් ලැබීම්		(104,514,426)	15,607,431
උපචිත වියදම් හා වෙන්කිරීම්		(29,747,059)	44,376,572
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		**(136,511,844)**	**4,431,360,823**
ගෙවූ සේවක පාරිතෝෂික		(11,958,720)	(5,374,943)
ගෙවූ පොළී		(63,244,126)	(32,877,346)
ගෙවූ බදු		(70,451,099)	(67,398,394)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(282,165,789)**	**4,325,710,140**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(15,423,824)	(17,090,457)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම		(710,500)	-
නොනිමි වැඩ		-	(236,885)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්			9,091,100
භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන විකිණීම්		(1,211,565,657)	(1,274,090,880)
අනෙකුත් මූල්‍ය වත්කම් ශුද්ධ ආයෝජන		2,317,651,167	2,152,578,325
ලද පොළී (ශුද්ධ බදු)		345,946,426	430,798,812
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය		**1,435,897,612**	**1,301,050,014**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය			
වර්ෂය තුළ ණය ගැණුම්		9,839,059,331	2,823,202,606
ලාභාංශ ගෙවීම්		-	(15,000,000)
වර්ෂය තුළ ණය පියවීම්		(10,530,789,713)	(8,774,705,293)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(691,730,383)**	**(5,966,502,687)**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන මුදල්		380,954,088	893,591,786
මුදල් හා මුදල් සමාන දෑ වර්ෂය තුළ සිදුවූ වෙනස්වීම්		**462,001,441**	**(339,742,534)**
වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		41,211,553	380,954,088
වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**(සටහන් 19)**	**503,212,993**	**41,211,553**

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ

අංක 88 සිට 130 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයන් සැලකිය යුතුයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1 සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

සාමාන්‍ය ප්‍රතිපත්ති

ලංකා පොහොර සමාගම ශ්‍රී ලංකාවේ වසර 50කට වැඩි කාලයක් ක්‍රියාත්මක වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ISO 9001:2008 සහතික ලත් සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමකි. ලංකා පොහොර සමාගම රසායනික පොහොර ආනයනය කිරීම, ගුණාත්මක පොහොර මිශ්‍රණය නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම, දීපව්‍යාප්ත ගබඩා ජාලය හරහා බෙදා හැරීම සහ එමගින් ශ්‍රී ලාංකේය ගොවීන්ගේ පොහොර අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කරයි.

1987 අංක 23 දරන පනත යටතේ රජයේ සංස්ථා සහ රජය සතු ව්‍යාපාර සීමිත වගකීම් සහිත සමාගම් බවට පරිවර්තනය කිරීම අනුව ලංකා පොහොර සංස්ථාව සීමාසහිත ලංකා පොහොර සමාගම බවට පත් කරන ලදී.

මෙම පරිවර්තනය 1992 සැප්තැම්බර් 15 දින සිට නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය. සීමාසහිත ලංකා පොහොර සමාගම දැනට 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පොදු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. සීමාසහිත ලංකා පොහොර සමාගමෙහි අරමුණ වන්නේ එය සාර්ථකව කරගෙන යාම සහතික කිරීමයි. 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සමාගම් පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද එහි පූර්වගාමියා වූ ලංකා පොහොර සංස්ථාව විසින් සිදු කරන ලද ව්‍යාපාර

1.2 මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාලය මාර්තු 31 දිනෙන් අවසන් වේ

1.3 සමාගමේ කොටස් ප්‍රාග්ධනය

සමාගම සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා භාණ්ඩාගාරය සතු වන අතර නිකුත් කර ඇති කොටස් ප්‍රාග්ධනය රුපියල් 10 බැගින් වූ සාමාන්‍ය කොටස් 50,245,608 කි.

1.4 සේවක සංඛ්‍යාව

2020 මාර්තු 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 388 (2019 - 364)

1.5 නිකුත් කිරීම සඳහා අවසර දුන් දිනය 2020 දෙසැම්බර් 04 වේ.

1.6 ලියාපදිංචි කාර්යාලයේ නීතිමය ස්වභාවය සහ ලිපිනය

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමක් සම්පූර්ණ අයිතිය මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරේ. ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ, වත්තල, හුණුපිටිය, ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවතේ පිහිටා ඇත.

1.7 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

සමාගමේ ආර්ථික සංවර්ධනයට සහ වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබාදුන් සිය දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලය හරහා සමාගම සාර්ථකව සහ අඛණ්ඩව ජාතියට පොහොර ලබා දෙනු ඇත. එය කාබනික පෙති පොහොර නිෂ්පාදනය කර දේශීය වෙළෙඳපොළට බෙදා හරින පළමු රාජ්‍ය සංවිධානය ලෙස ද සැලකේ

අනුකූලතා ප්‍රකාශය

1.8 අකණ්ඩ පැවැත්ම

කලමනාකාරිත්වය, ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර, අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය නොදනී. එබැවින්, සමාගමේ මූල්‍ය ප්‍රකාශය අඛණ්ඩව ක්‍රියාත්මක වන පදනම මත සකස් කරනු ලැබේ.

1.9 බදුකරණය

2016 අංක 10 දරන දේශීය ආදායම් පනතට සහ 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතට අනුව බදු අරමුණු සඳහා සකස් කරන ලද වර්ෂය සඳහා ලාභය පදනම් කරගෙන බදුකරණය සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

අ) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම ප්‍රකාශ සකස් කර ඇත

(අ) මිනුම් පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශන වෙතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ වෙතිහාසික පිරිවැය සම්මුතිය යටතේ වන අතර, ඉඩම් සහ ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම මගින් වෙනස් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ විනිශ්චයක් හෝ සංකීර්ණත්වයක් හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර 2.26 සටහනේ අනාවරණය කර ඇත.

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ පහත අයිතම හැරුණු විට සමාගමේ මූල්‍ය ප්‍රකාශන වෙතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ වගකීම, අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම ලෙස පිළිගැනේ
- සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි අත්පත් කර ගැනීමේදී පිරිවැය සහ පසුව නැවත තක්සේරු කරන ලද මුදලින් මනිනු ලැබේ, ඒවා නැවත ඇගයීමේ දිනයේ සාධාරණ වටිනාකම් වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) අනුව සකස් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ එහි සටහන් සමඟ මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව.

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමක් මත සහ වෙනත් විස්තීර්ණ හරහා සාධාරණ වටිනාකමින් යුත් ඉඩම, ගොඩනැගිලි, ආයෝජන දේපළ සහ මූල්‍ය වත්කම් හැර වෙතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

ආදායම් ඉදිරිපත් කිරීම සහ ක්‍රියාකාරී මුදල් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගම් ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් වන අතර එය සමාගම ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය වේ.

සමාන අයිතමවල සෑම ද්‍රව්‍ය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිතව ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 1 මගින් 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' මත අවසර දී ඇති පරිදි අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයේ අයිතමයන් ද්‍රව්‍යමය නොවේ නම් ඒවා වෙන වෙනම ඉදිරිපත්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

කෙරේ. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ තනි සටහන් සමඟ සාකච්ඡා කෙරේ.

සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සහ අන්තර් කාල පරිච්ඡේද සංසන්දනය වැඩි දියුණු කිරීම සඳහා මුල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම මුදල් ප්‍රමාණයන් සඳහා ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක තොරතුරු පෙර කාල සීමාවට අදාළව අනාවරණය කරනු ලැබේ.

පෙර වසරවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩා හොඳ ඉදිරිපත් කිරීම සඳහා අදාළ වන පරිදි සහ වත්මන් වර්ෂය සමඟ සැසඳිය හැකි පරිදි සංශෝධනය කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති I, II සහ III වෙළුම් වාර්තා කිරීමේදී සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇත.

මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කර ඇති විට වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම සඳහා සංසන්දනාත්මක ප්‍රමාණයන් ද ධාරාවට අනුකූල වන පරිදි නැවත වර්ගීකරණය කර ඇති බව ද අනාවරණය වේ. එබැවින් SLPSAS සහ භාණ්ඩාගාර මාර්ගෝපදේශ අනුව ස්ථාවර වත්කම්, ජංගම වත්කම් සහ කොටස් වර්ගීකරණ දෝෂ නිවැරදි කර ඇත.

පෙර වසරවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩා හොඳ ඉදිරිපත් කිරීම සඳහා අදාළ වන පරිදි සහ වත්මන් වර්ෂය සමඟ සැසඳිය හැකි පරිදි සංශෝධනය කර ඇත.

සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය අදාළ පුද්ගල සටහන් සමඟ ඊළඟ පිටුවල අනාවරණය කර ඇත. එක් එක් සටහන සමඟ ඉදිරිපත් කරන ලද එම ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් අඛණ්ඩව යොදවා ඇත. තනි සටහන් වලින් ආවරණය නොවන අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති. සමාගම විසින් අඛණ්ඩව යෙදී ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් ලෙස සලකනු ලබන නමුත් වෙනත් කිසිදු අංශයකින් ආවරණය නොවේ.

ජංගම එදිරිව ජංගම නොවන වර්ගීකරණය

සමාගම ජංගම / ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි. වත්කමක් වත්මන් වේ:

- සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ පරිභෝජනය කිරීමට අපේක්ෂා කෙරේ
- මූලික වශයෙන් වෙළඳාමේ අරමුණ සඳහා පවත්වනු ලැබේ
- වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ, හෝ
- වාර්තාකරණ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීමක් නුවමාරු කර ගැනීම හෝ භාවිතා කිරීම සීමා කර නොමැති නම් හැර මුදල් හෝ සමාන මුදල් අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත.

වගකීමක් වත්මන් ලෙස සලකනු ලබන්නේ:

- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ නිරාකරණය කිරීමට බලාපොරොත්තු වේ

- එය මූලික වශයෙන් වෙළඳාමේ අරමුණ සඳහා පවත්වනු ලැබේ
- එය වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට නියමිතය, හෝ
- වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම් පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත.

සමාගම අනෙකුත් සියලුම වගකීම් වත්මන් නොවන ලෙස වර්ගීකරණය කරයි.

කල් දැමූ බදු වත්කම් සහ වගකීම් ඒ අනුව ජංගම නොවන වත්කම් සහ වගකීම් ලෙස වර්ග කෙරේ

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්, වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කාල සීමාවන්ට අඛණ්ඩව යෙදී ඇත.

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය, අදාළ අවස්ථාවල දී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වසරේ ඒවා සමඟ සැසඳිය හැකි පරිදි සංශෝධනය කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද SLAS අනුව ගිණුම්කරණ ප්‍රමිති වාර්තා කිරීමේදී සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇත

මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම සඳහා සංශෝධනය කර ඇති බව ද අනාවරණය වේ.

2.3 විදේශ මුදල් ගණුදෙණු

2.3.1 මෙහෙයුම් හා ඉදිරිපත් කරන මුදල් ඒකකයන්

